ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

இலங்கைப் பாராளுமன்றம்

Parliament of Sri Lanka

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2022

වැය ශීර්ෂය
தலைப்பு
Head — **16**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

இலங்கைப் பாராளுமன்றம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே

Parliament of Sri Lanka, Sri Jayewardenepura Kotte

2022 සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

වැය ශීර්ෂය 16

<u>**අන්තර්ගතය**</u>

පරිච්ඡේදය 1 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**1**
පරිච්ඡේදය 2 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**7**
පරිච්ඡේදය 3 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	**49**
පරිච්ඡේදය 4 - කාර්ය සාධක දර්ශකය	**53**
පරිච්ඡේදය 5 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	**54**
පරිච්ඡේදය 6 - මානව සම්පත් පැතිකඩ	**56**
පරිච්ඡේදය 7 - අනුකූලතා වාර්තාව	**57**

පරිච්ඡේදය - 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

හැඳින්වීම

පාර්ලිමේන්තුව යනු විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන ප්‍රජාතන්ත්‍රවාදයේ කුළුණු තුනෙන් එකක් වන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාදායකයයි. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනතාවගේ අභිලාශය තහවුරු කිරීමට ඔවුන් නියෝජනය කිරීම , නීති සම්පාදනය කිරීම සහ රාජ්‍ය මුදල් පාලනය කිරීම සඳහා ප්‍රතිපාදන සලස්වයි.

ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය පිහිටා ඇත්තේ එහි ජනතාව මත වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) ව්‍යවස්ථාවේ මහජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කළ යුත්තේ මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් බව සඳහන් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වැනි ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුවේ නියෝජිත බලය නිරූපණය වන අතර පාර්ලිමේන්තුවට පැවරී ඇති එම ව්‍යවස්ථාදායක බලය 75 වැනි ව්‍යවස්ථාවේ තවදුරටත් අවධාරණය කර ඇත. 76 වැනි ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුව සතු අන්සතු කළ නොහැකි ව්‍යවස්ථාදායක බලය සහ නීති සම්පාදනයේලා එය සතු වැදගත් කාර්යභාරය සඳහන් කරයි. පාර්ලිමේන්තුවේ කටයුතු නියාමනය කරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සහ ඊට ආනුෂංගික කරුණුවලට 74 ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පවතින රීති වල තත්ත්වය ලබා දී ඇත.

4(ඇ) ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, මුක්තිය සහ බලතල පිළිබඳ කාරණා සම්බන්ධයෙන් හැර ජනතාවගේ අධිකරණ බලය අධිකරණ හරහා පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි සහ 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත මඟින් පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, මුක්තිය සහ බලතලවල වැදගත්කම ද 67 වැනි වගන්තිය මඟින් පිළිගනී. එවැනි වරප්‍රසාද, මුක්තිය සහ බලතල සුරක්ෂිත කිරීම ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක කිරීම රටේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති අතර 42 ව්‍යවස්ථාව මඟින් විධායකය පිළිබඳ අධීක්ෂණය පාර්ලිමේන්තුව විසින් තවදුරටත් නියම කර ඇති අතර අධීක්ෂණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාවර නියෝග මඟින් පාර්ලිමේන්තුවට පහසුකම් සපයයි.

148 ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ පාර්ලිමේන්තුවට රාජ්‍ය මුදල් පිළිබඳ පූර්ණ පාලනය තිබිය යුතු බවයි.

2001 ජූනි 20 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී ලබා දුන් ඓතිහාසික තීන්දුවක් ලෙස, එවකට කථානායක ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය යළි තහවුරු කළේය.

ශ්‍රී ලංකාව ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වන අතර, ප්‍රජාතන්ත්‍රවාදය සහ තිරසාරභාවය සඳහා වන එහි කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ව්‍යවස්ථාපිතව පිළිගත් කාර්ය මණ්ඩලයක් පාර්ලිමේන්තුවට සහාය දක්වයි. 2012 ඔක්තෝම්බර් 9 වැනි දින කථානායකවරයාගේ තීන්දුව මඟින් කථානායක කාර්යාලය සහ පාර්ලිමේන්තු මහලේකම්වරයා කාර්ය මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බලයෙන්, අධිකාරියෙන් සහ තරාතිරමෙන් අසමසම කාර්යාල දෙකක් ලෙස හඳුනාගෙන ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 (1) ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තු මහලේකම් පත් කිරීම සඳහා විධිවිධාන සලසා ඇති අතර 65 (3) ව්‍යවස්ථාව මඟින් මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කථානායකවරයාගේ අනුමැතිය ඇතිව මහලේකම්වරයා විසින් විසින් පත් කරනු ලබයි.

ලේකම් කාර්යාලය යනු රාජ්‍ය සේවයෙන් ස්වාධීන වන නිලධාරීන්ගේ වෘත්තීය, පක්ෂග්‍රාහී නොවන සේවා ව්‍යුහයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වැනි ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තු මහලේකම්වරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය රාජ්‍ය නිලධාරීන් ගණයට අයත් නොවන නිලධාරීන් ලෙස අර්ථනිරූපණය කර ඇති අතර එමගින් ලේකම් කාර්යාලයට ස්වාධීන ආයතනයක් ලෙස විශේෂ පිළිගැනීමක් ලබා දී ඇත. කාර්ය මණ්ඩලයට අදාළ ඕනෑම කරුණක් 1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත මගින් නියාමනය කරනු ලබන අතර, එය පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු සහ මූල්‍ය රෙගුලාසි සැකසීම සඳහා විධිවිධාන මෙම පනතින් සලසා ඇත. කාර්ය මණ්ඩලය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මහලේකම්වරයාට උපදෙස් හා මඟ පෙන්වීම සඳහා කාර්ය මණ්ඩල උපදේශක කමිටුවක් පිහිටුවීමට ද මෙම පනතෙන් විධිවිධාන සලසා ඇත.

එහි මූලික වගකීම ලෙස, පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ ව්‍යවස්ථාපිත ජනවරම ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි පිළිබඳ අවබෝධය මෙන්ම පර්යේෂණ, තාක්ෂණික සහ පරිපාලන සහාය ලබා දෙයි. පාර්ලිමේන්තුව ජනතාව සහ ඔවුන්ගේ නියෝජිතයන් අතර පවත්නා දුරස්ථභාවය ඉවත් කිරීම සඳහා ලේකම් කාර්යාලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. විශිෂ්ට සේවාවක් සැපයීමේ අරමුණින් 2022 වර්ෂයේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබූ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ හැඳින්වීමක් මෙම වාර්තාවෙන් සැපයෙන අතර වැය ශීර්ෂ 16 යටතේ 2022 වර්ෂයට අදාලව සමස්ථ මූල්‍ය කාර්ය සාධනය මේ තුළ අන්තර්ගත වේ.

ආයතනයේ දැක්ම, මෙහෙවර , අරමුණු

දැක්ම

ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය ප්‍රවර්ධනය කරන ඵලදායි හා කාර්යක්‍ෂම මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් වීම.

මෙහෙවර

ව්‍යවස්ථා සම්පාදකයන්, ජනතා නියෝජිතයන් සහ රටෙහි මහජන මුදල් භාවිතය සියුම් ලෙස පිරික්සන්නන් ලෙස සිය කාර්යයන් සඵලදායී සහ වඩා කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උපකාරී වන කාර්යය පටිපාටිමය උපදෙස් සහ පහසුකම් සැපයීම.

පාර්ලිමේන්තුවේ ප්‍රධාන අරමුණු

1. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීම
2. රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලනය ක්‍රියාත්මක කිරීම
3. විධායකය සම්බන්ධයෙන් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම

සංවිධාන ව්‍යුහය

ගරු කථානායකතුමා ප්‍රමුඛත්වය දරන පාර්ලිමේන්තුවේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ලේකම් සහ කාර්ය මණ්ඩල සේවාවන් සැපයීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. (සංවිධාන ව්‍යුහය සඳහා කරුණාකර ඇමුණුම 02 බලන්න)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලයට අයත් දෙපාර්තමේන්තු

වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

වේත්‍රධාරීවරයා පාර්ලිමේන්තුවේ බලාධිකාරය සංකේතවත් කරන "සෙංකෝලයේ" භාරකාරිත්වය හොබවන අතර සභාව තුළදී මූලාසනය විසින් දෙනු ලබන නියෝගයන් ක්‍රියාත්මක කරනු ලබන නිලධාරියා ඔහුය. සභා ගර්භය තුළදී පාර්ලිමේන්තුවේ බල අධිකාරය සංකේතවත් කරන "සෙංකෝලයේ" භාරකාරත්වය සහ ආරක්ෂාව මෙන්ම කථානායකවරයාට සේවය ලබා දීම සහ සභාවේ විධායක අධිකාරය වන කථානායකවරයාට සේවය කිරීම තුළින් පැන නැගෙන අනෙකුත් කාර්යභාරයන් ඉටු කිරීම හා පාර්ලිමේන්තු සභාව සහ කාරක සභා කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කරන උපකාරක කාර්ය මණ්ඩලය සහ පහසුකම් ලැබෙන බව සහතික කිරීම තුළින් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සහය ලබා දීම වේත්‍රධාරී දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ මෙන්ම අමුත්තන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඍජුවම සම්බන්ධවන අංශයක් වන වේත්‍රධාරී දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු සංකීර්ණය තුළ ආරක්ෂා සහිතවූත් සුරක්ෂිතවූත් පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සියළු කටයුතු සම්පාදනය කරනු ලබයි.

පරිපාලන දෙපාර්තමේන්තුව

තරඟකාරී පරිසරයක් තුළ සිය රාජකාරී කටයුතු ඵලදායක ලෙස ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි ඔවුන්ගේ පුද්ගල සංවර්ධනය හා යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවෙන් උපායමාර්ගික වශයෙන් දායක විම පරිපාලන දෙපාර්තමේන්තුවෙහි මුඛ්‍ය කාර්ය භාරය වේ.

සීඝ්‍රයෙන් වෙනස්වන පරිසරයක් තුළ, මෙම උත්තරීතර ආයතනයෙහි අරමුණු හා අභියෝග සාර්ථක ලෙස සාක්ෂාත්කර ගැනීම සහ සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස ශක්‍ය වීමේ කාර්යය සඳහා, තීරණ උපාය මාර්ගික වශයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍යවන්නාවූ නිවැරදි ආකල්ප හා දැනුම සහිත ක්‍රියාශීලී කාර්ය මණ්ඩලයක් අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිය භාරධූර වගකීම් අවබෝධ කරගන්නා ලදුව, පරිපාලන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි කාර්යසාධනය, අඛන්ඩ සංවර්ධනය හා යහපැවැත්ම වෙනුවෙන් ඉතා දැඩි සේ කැප වී සිටී. මෙම කාර්යය උදෙසා සුභවාදී වෙනසක් ඇති කිරීම වෙනුවෙන් නිරන්තරයෙන් ප්‍රයත්න දරන අතර මානව සම්පත් කළමනාකරණයෙහි නිවැරදි ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාමාර්ග මඟින් ආයතනය මෙහෙයවීම පිණිස, මානව සම්පත් ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා සැකසීමේ බලය පරිපාලන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත.

හැන්සාඩ් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුව තුළ සිදු කරනු ලබන සෑම කථාවක්ම අඩංගු ''හැන්සාඩ් වාර්තාව'' සකස් කිරීම සහ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සටහන් සකස් කිරීම හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

හැන්සාඩ් සංස්කාරක, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්, සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්, ජ්‍යෙෂ්ඨ හැන්සාඩ් වාර්තාකරුවන් සහ හැන්සාඩ් වාර්තාකරුවන් යන නිලධාරීන්ගෙන් සමන්විත මෙම දෙපාර්තමේන්තුව, කාරක සභා වාර්තාකරුවන්ගේ ඒකකයකින්ද, සුචි සම්පාදන ඒකකයකින් ද, කථා පටිගත කිරීමේ ඒකකයකින් ද සමන්විත ය.

පාර්ලිමේන්තු විවාද පැවැත්වෙන අතරතුර ප්‍රකාශ කරනු ලබන, ශ්‍රවණය වන සෑම වචනයක්ම හැන්සාඩ් වාර්තාකරුවන් විසින් වාර්තා කර ගෙන, ඔවුන් විසින් ඒවා අත් පිටපත් කර, එම පිටපත් පරීක්ෂා කර බලා දෝෂ තිබේ නම් නිවැරදි කිරීම සඳහා සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන් වෙත භාර දෙනු ලැබේ. එසේ නිවැරදි කරන ලද පිටපත්, ඉන්පසුව එක් එක් අංශයේ නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරක වෙත භාර දෙනු ලැබේ.

ඉන්අනතුරුව සිදු කෙරෙන සියලුම කටයුතු හැන්සාඩ් සංස්කාරක වෙත පැවරෙන අතර, මුද්‍රණය කර පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යවනු ලබන අවසන් පිටපත සකස් කිරීමේ වගකීම හැන්සාඩ් සංස්කාරකට පැවරේ.

සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු සංකීර්ණයෙහි, කථානායකතුමාගේ නිල නිවසෙහි, ශ්‍රාවස්තියෙහි, මාදිවෙල හා ජයවඩනගම නිවාස සංකීර්ණයෙහි පිහිටි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා කාර්ය මණ්ඩල නිල නිවාසවල සහ නුවරඑළියේ පිහිටි සෙන්පති නිවසෙහි අවශ්‍ය සියලුම සිවිල් නඩත්තු කටයුතු සඳහා 1990 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

විදුලි සෝපාන, ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය, සමීප රූප ආවේක්ෂණ කැමරා පද්ධතිය (සී. සී. ටී. වී.), ප්‍රධාන රූපවාහිනී ඇන්ටනා පද්ධතිය (එම්.ඒ ටී. වී), ශබ්ද පද්ධතිය, ශීත කාමර ආදී සියළුම සේවා සහ උපකරණ පද්ධතිවල මනා ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ අනුබද්ධ දෙපාර්තමේන්තුවල නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරීම (ලංකා විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය) මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා සහ පිළිසකර කටයුතු පිළිබඳව සැලකිලිමත් වීම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නව ඉදිකිරීම් සිදු කිරීම, නව ඉදිකිරීම් සඳහා මිල ගණන් කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම මෙන්ම විදුලි උපකරණ හා පද්ධති නඩත්තු කිරීම්හි අවශ්‍ය අළුත්වැඩියා කිරීම සිදු කරනු ලබයි.

ආහාරපාන හා ගෘහපාලන දෙපාර්තමේන්තුව

1982 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පාර්ලිමේන්තු සංකීර්ණයට සපැමිණීමත් සමගම ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව පාර්ලමේන්තුවේ අළුත්ම දෙපාර්තමේන්තුවක් වශයෙන් බිහි වූයේ තරු පංතියේ හෝටල් ක්ෂේත්‍රයේ අන්තර්ජාතික ප්‍රමුඛ පෙලේ හෝටලයක් වූ ලංකා ඔබරෝයි හෝටලයේ තාක්ෂණික හා වෘත්තීයමය ප්‍රවීනත්ව මෙහෙයුම් හා උපදේශකත්වය යටතේය. පසු කලකදී මෙම දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව අද වන විට ක්‍රියාත්මකව පවතී.

මෙම අංශය ආහාර භෝජනාගාර හා ගෘහපාලන අධ්‍යක්ෂවරයෙකුගේ යටතට ගැනෙන අතර, මුළුතැන්ගෙය, භෝජනාගාර හා ගෘහපාලන වශයෙන් ප්‍රධාන උප අංශ තුනක් යටතේ ක්‍රියාත්මක වෙයි.

ප්‍රධාන වශයෙන් ආහාරපාන භෝජනාගාර සේවා අංශ 12කින් සමන්විත වන අතර ආපනශාලා, විධායක භෝජනාගාර, ආහාර හා සැපයුම් අංශය, ප්‍රභූ භෝජනාගාර වශයෙන් සංවිධිත වන අතර ඉන් 5 ක් දිනපතාම ක්‍රියාත්මකතාවයේ පවතිමින් පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින හැරුණු කොට දිනකට පුද්ගලයින් 1000 – 1200 අතර ප්‍රමාණයකට පහසුකම් සපයනු ලබයි.

දෙපාර්තමේන්තුවේ තවත් ප්‍රධාන රාජකාරියක් වන්නේ, මහල් 5 කින් සමන්විතවන සම්පූර්ණ ගොඩනැගිල්ලේත්, සුවිශේෂී ප්‍රභූන්ගේ අවශ්‍යතාවයන් පරිදි ඉතාමත් උසස් තත්ත්වයේ සනීපාරක්ෂක කටයුතු මෙන්ම ගෘහ පාලන කටයුතු මෙහෙයවා ගැනීමයි. එමෙන්ම රාජකාරි මට්ටමෙන්ද වෘත්තීය මට්ටමෙන්ද පාර්ලිමේන්තු පරිශ්‍රය පරිහරණය කරන සෑම සියළු දෙනාටම යෝග්‍ය පරිදි ගෘහ පාලන සේවාව මැනවින් පවත්වා ගැනීමයි.

තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා පිළිබඳව වගකීම දරනු ලබන්නේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසිනි.තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලබන්නේ 2004 වර්ෂයේ අග භාගයේදීය. නව තාක්‍ෂණය මුසුවුනු තොරතුරු පද්ධති මගින් පාර්ශ්වකරුවන් ශක්තිමත් කිරීම තම දැක්ම කර ගත් තොරතුරු පද්ධති හා කළමණාකරන දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයේ කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව උසස් මට්ටමකට ගෙන ඒම සඳහා වර්තමානයේදී සුවිශේෂි කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. පාර්ලිමේන්තුවේදී ගනු ලබන තීරණ හා වැදගත් කාරණා සම්බන්ධ දැනුම සහ තොරතුරු මගින් පොදු ජනතාව සවිබලගැන්වීම හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාර කරනු වස්, ඔවුන්ට නිවැරදි සහ කාලෝචිත තොරතුරු කාර්යක්‍ෂමව සැපයීම මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ නීති සම්පාදන ක්‍රියාවලියට සහායවීම, ව්‍යවස්ථාදායකයේ වැඩ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීම, විධායකය විසින් පාර්ලිමේන්තුවට සහ මහජනතාවට තිබෙන වගකීම හා වගවීම සහතික කිරීම පිණිස විවිධ කාරක සභා මගින් අධීක්ෂණය හා රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වැඩ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ට නීති සම්පාදකයින් වශයෙන් ඔවුන්ට අවශ්‍ය පර්යේෂණ සහ විවාද විෂය තොරතුරු පහසුකම් සැපයීම, ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී සන්ධාන භාෂාව සමඟ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පනත් කෙටුම්පත්, නියෝග, නියමයන්, රීති, රෙගුලාසි යනාදී අනුනීති, ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික වාර්තා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත්පාලන ආයතනවල කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට පිළිගැන්වීම, ඒවා අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම, පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ න්‍යාය පත්‍ර, න්‍යාය පුස්තක හෝ ඒ හා සම්බන්ධ පරිපූරක, කාර්ය සටහන්, දිනට නියමිත වැඩ පිළිවෙළ භාෂා ත්‍රිත්වයෙන් සකස් කිරීම යනාදියට අදාළ සියලු කාර්යයන්වලට සක්‍රීය දායකත්වය ලබාදීම ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව

මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ කළමනාකරණ කටයුතුවලදී ප්‍රධාන මෙහෙයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (මුදල්), මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ. ගිණුම් නිලධාරි ලෙස අධ්‍යක්ෂ (මුදල්) විසින් මූල්‍ය කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට සෘජුවම වාර්තා කිරීම සහ උපදෙස් දීම සිදු කරනු ලබයි.

ගිණුම් නිලධාරි වශයෙන් පැවරෙන සාමාන්‍ය වගකීම් ඉටු කිරීම සහ රජයේ මුදල් රෙගුලාසි, නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන්ට අනුව මුදල් කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා මුදල් පාලක කාර්යයන් ඉටු කිරීම ද වත්කම්වල ආරක්ෂාව හා වත්කම්වල කාර්යක්ෂමභාවය සහතික කිරීම, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ නැංවීමද අධ්‍යක්ෂ (මුදල්) යටතේ ඇති ප්‍රධාන කාර්ය භාරයන් වේ.

සංනිවේදන දෙපාර්තමේන්තුව

මහජනතාව වෙත තොරතුරු ගෙන යන පාර්ශවකරුවන්හට අදාළ තොරතුරු ලබා ගත හැකි කාර්යක්ෂම මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් දක්වා වත්මන් පාර්ලිමේන්තුව වර්ධනය කිරීම උදෙසා සන්නිවේදන දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේ පිහිටුවා ඇත. අධ්‍යක්‍ෂ (සන්නිවේදන) විසින් මෙහෙයවනු ලබන මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම පුරවැසියන්, මාධ්‍ය, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම තම දැක්ම කර ගෙන ඇත. මෙම දෙපාර්තමේන්තුව යටතේ මාධ්‍ය අංශය හා මහජන සේවා ලෙස අංශ දෙකක් යටතේ කළමණාකරුවන් දෙදෙනෙකු යටතේ ක්‍රියාත්මක වේ.

පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදනයන් කළමනාකරණය කිරීම, සන්නිවේදන උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සහ සියළුම සන්නිවේදන සැලසුම් සකස් කිරීම සිදු කරයි. ව්‍යාපෘති කළමණාකරණය, සංස්කරණය කිරීම මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලබන අතර මහජනතාව සහ පාර්ලිමේන්තුව අතර මනා සහ සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සහ විවෘත මහජන සහභාගිත්වයක් සඳහා පහසුකම් සැපයීම මහජන සේවා අංශය මගින් සිදු කරනු ලබයි.

පරිච්ඡේදය - 02
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්යාලයට අයත් දෙපාර්තමේන්තු විසින් 2022 වර්ෂයේ ඉටු කරනු ලැබූ කාර්යයන්ගේ ප්‍රගතිය පහත පරිදි වේ.

<u>ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව</u>

නීති සම්පාදනය හා මහජන මුදල් භාවිතය අධීක්ෂණය කිරීම යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සපයයි.

පහත සඳහන් කාර්යාංශ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. එනම්

1. සභා ලේඛන කාර්යාංශය
2. පනත් කෙටුම්පත් කාර්යාංශය
3. අමාත්‍යාංශීය උපදේශක කාරක සභා කාර්යාංශය
4. කාරක සභා කාර්යාංශය
5. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශය
6. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා කාර්යාංශය
7. මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය
8. කථා පරිවර්තක කාර්යාලය
9. පුස්තකාලය.

එම එක් එක් කාර්යාංශය විසින් 2022 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන්හි කාර්ය සාධනය පහතින් දක්වා ඇත.

<u>සභා ලේඛන කාර්යාංශය</u>

<u>මෙහෙවර</u>

පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අදාළ සභාවේ සියලු වැඩකටයුතු කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.

2022 වර්ෂයේ සභා ලේඛන කාර්යාංශයේ ප්‍රගතිය

<u>ප්‍රධාන රාජකාරි</u>

(1) 2022 වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 101 ක් වෙනුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තක 04 ක් හා ඒ හා සම්බන්ධ පරිපූරක 45 ක්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභාලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලයේ සහාය ඇතිව මුද්‍රණය කිරීමෙන් අනතුරුව එම මුද්‍රිත ලේඛන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, අමාත්‍යාංශ ලේකම්වරයන්ට, අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට, මාධ්‍ය ආයතනවලට සහ පාර්ලිමේන්තුවේ හා

අදාළ අනෙකුත් ආයතනවල ප්‍රධානීන්ට හා අදාළ වෙනත් නිලධාරින්ට දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

ඊට අමතරව එළඹෙන රැස්වීම් දිනයේදී එකී ලේඛන සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේම සභා මේසය මත තැබීමටත්, පාර්ලිමේන්තුවේ අනෙකුත් අදාළ අංශ වෙත ඒවා බෙදාහැරීමටත් කටයුතු කර ඇත.

(2) 2022 වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 101 වෙනුවෙන් න්‍යාය පත්‍ර 101 ක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභාලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලයේ සහාය ඇතිව මුද්‍රණය කිරීමෙන් අනතුරුව අදාළ රැස්වීම් දිනයන්හිදී පාර්ලිමේන්තුවේ එක් එක් මන්ත්‍රීවරයාගේ සභා මේසය මත තැබීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන ලද සෑම මාසයකම, අදාළ රැස්වීම් සතියේ පළමුවැනි රැස්වීම් දිනයන්හිදී පමණක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අදාළ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට, සියලුම අමාත්‍යාංශ ලේකම්වරයන්ට හා ඊට අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට, මාධ්‍ය ආයතනවලට සහ පාර්ලිමේන්තුවේ හා අදාළ අනෙකුත් ආයතන ප්‍රධානීන්ට හා අදාළ නිලධාරින්ට දේශීය අධිවේගී තැපැල් සේවය මඟින් බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.

(3) එකී වර්ෂයට අදාළව පැවති පාර්ලිමේන්තු රැස්වීම් දින 101 වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කාර්ය සටහන් 101 ක් ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් සභාලේඛන කාර්යාංශය විසින් සකස් කරනු ලැබ රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.

(4) අමාත්‍යාංශ, ඒවා යටතට ගැනෙන දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළව ඒ ඒ අමාත්‍යාංශවලින් යොමු කරනු ලබන කාර්ය සාධන සහ වාර්ෂික වාර්තා 528 ක්, විවිධ අණ පනත් යටතේ ඉදිරිපත් කරනු ලැබ අති විශේෂ ගැසට්පත්‍රවල පළ කරන ලද නියෝග, රෙගුලාසි සහ නියමයන් අඩංගු යෝජනා ද, යෝජනා සම්මතයන්ද ඇතුළත් අනු නීති (Subordinate Legislation) පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට කටයුතු කර ඇත.

(5) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් භාර දෙන ලද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 947 ක් ද වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න 07 ක් ද ලියාපදිංචි කරන ලදුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සංස්කරණය කර, අදාළ පරිදි අනෙකුත් භාෂාවන්ට (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) පරිවර්තනය කරවාගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට හෝ අදාළ පරිදි න්‍යාය පුස්තක පරිපූරකවලට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

(6) ජනාධිපතිවරයාගෙන් ලැබුණු සංදේශ 15 ක් ද, කථානායකවරයාගේ නිවේදන 157 ක් ද, පෞද්ගලික මන්ත්‍රී යෝජනා 90 ක් ද, ආණ්ඩුවේ පනත් කෙටුම්පත් 48 ක් සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 25 ක් ද, ඇතැම් පනත් කෙටුම්පත්වලට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ, ගරු කථානායකතුමා විසින් කරනු ලබන ලිපිලේඛන පිළිගැන්වීම්ද ඇතුළත්ව අමාත්‍යවරයන් විසින් කරනු ලබන ලිපිලේඛන පිළිගැන්වීම යනාදිය ඇතුළත් පාර්ලිමේන්තුවේ රැස්වීම් දින 101 කට අදාළ දිනට නියමිත වැඩපිළිවෙළ (Order of Business) සකස් කිරීමේ කටයුතු සම්පාදනය කර ඇති අතර එම ලේඛන මුද්‍රණය කර අදාළ පාර්ශ්වයන්ට ලබාදීමත්, පාර්ලිමේන්තුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ කාර්යාංශයන්හි දැනගැනීම සඳහා පාර්ලිමේන්තුවේ අන්තඃජාලයට උඩුගත කිරීමට කටයුකරන ලදී.

(7) 2022 වර්ෂයට අදාළව අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරයන් සම්බන්ධිත ශෝක ප්‍රකාශ යෝජනා 15 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඊට අදාළව සකස් කරනු ලබන හැන්සාඩ් වාර්තාවේ උද්ධෘතයන්ද, පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් ද සහිතව සකස් කර අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ කලත්‍රයාට හෝ සමීප ඥාතීන්ට යැවීමට කටයුතු කර ඇත.

(8) පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළව කථානායකවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන සහ තීරණ සකස් කිරීමට සහාය දක්වා ඇත.

(9) පාර්ලිමේන්තුවේ රැස්වීම් මෙහෙයවීමට පහසුවන පිණිස මූලාසනයට සහ ලේකම් මණ්ඩලයට සියලුම ලිපි ලේඛන ඇතුළත් ලිපිගොනු වෙන් වෙන් වශයෙන් සකස් කිරීම, පාර්ලිමේන්තු රැස්වීම් 101 ක් සඳහා සිදු කර ඇත.

(10) 2022.08.30 සිට 2022.09.02 දක්වා දිනයන්හිදී 2022 වසරේ විසර්ජන පනත් (සංශෝධන) කෙටුම්පතට අදාළ විවාදය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ද, 2022.11.14 වැනි දින සිට 2022.12.08 වැනි දින දක්වා සෙනසුරාදා දිනයන්ද ඇතුළුව දින 26 ක් තුළ 2023 විසර්ජන පනත් කෙටුම්පතට අදාළ විවාදය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ද සිදු කරන ලදී.

(11) 2022 වර්ෂයේදී පවත්වන ලද පාර්ලිමේන්තු රැස්වීම් දින 101 ක් සම්බන්ධයෙන් කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඇතුළු මූලාසනයටත්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, නියෝජ්‍ය මහ ලේකම්වරයා සහ සහකාර මහ ලේකම්වරයා ඇතුළු ලේකම් මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ රැස්වීම් ආරම්භ කිරීමට පෙර අදාළ දිනට නියමිත සභාවේ වැඩකටයුතු පිළිවෙළ සභාලේඛන කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයන් විසින් සංක්ෂිප්ත ලෙස පැහැදිලි කිරීම් සිදු කර ඇත.

(12) ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වරට 1981 අංක 02 දරන ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාරව 2022.07.20 වැනි දින පැවති පාර්ලිමේන්තුව තුළින් ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමට අදාළව සියලු ලිපි ලේඛන සැකසීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

(13) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව 2022 වසර තුළදී අවස්ථා 38 කදී රැස්වී ඇති අතර, එයට අමතරව පක්ෂ නායක රැස්වීම් 09 ක් ද විශේෂිත රැස්වීම් 03 ක්ද පවත්වා ඇත. එම රැස්වීම් පැවැත්වීමට අදාළ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමටද එම රැස්වීම් අවසානයේ කාර්ය සටහන් භාෂාත්‍රයෙන් සකස් කිරීමටද පියවර ගන්නා ලදී.

(14) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සියලුම දත්ත සහ තොරතුරු ඇතුළත් පරිගණක මෘදුකාංග වැඩසටහන පවත්වාගෙන යෑම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විවිධ ඉල්ලීම් සහ වෙනත් අවශ්‍යතා මත ඒවා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට නොපමාව කටයුතු කර ඇත.

(15) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ නම් සිංහල අකාරාදිය අනුව සහ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ව්‍යාවස්ථාදායක තොරතුරු පරිගණක පද්ධතිය තුළ වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යෑමට කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම් සඳහා අදාළ නම් ලැයිස්තු සිංහල අකාරාදී ක්‍රමය අනුව ඉංග්‍රීසි භාෂාවෙන්, සාරාංශ සටහන් ද සමඟ අදාළ යාවත්කාලීන කිරීම් සමඟ පවත්වාගෙනයාම සිදු කර ඇත.

(16) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පක්ෂයෙන් පහකරනු ලැබූ අවස්ථාවක, එම පහකිරීම අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන පෙත්සමක් සම්බන්ධයෙන් හෝ වෙනත් අදාළ අධිකරණ කටයුතු සම්බන්ධයෙන් හෝ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වගඋත්තරකරුවෙකු ලෙස පෙනී සිටීමට නියම කර තිබෙන අවස්ථාවකදී එකී පෙත්සම් පිළිබඳ ලිඛිත නිරීක්ෂණ සකස් කිරීම, පෙරකලාසි සකස් කිරීම සහ අනෙකුත් සියලු ලිපි ලේඛන අදාළ පරිදි සූදානම් කිරීම හා නීතිපතිවරයා සමඟ අදාළ ලිපි ගනුදෙනු කිරීම සිදු කර ඇත. 2022 වර්ෂයේදී මෙම විෂය යටතේ පක්ෂයෙන් නෙරපා හැරීම් සම්බන්ධ නඩු කටයුතු 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. මීට අමතරව විවිධ අණ පනත් යටතේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන අනු නීති (Subordinate Legislation) සම්බන්ධ අධිකරණ කටයුතුවලදී ඒ සම්බන්ධව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවලදී සාක්ෂි ලබාදීම සහ ඊට අදාළ තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරඇත.

(17) ගරු කථානායකතුමා සහහෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වගඋත්තරකරුවකු කරමින් / ,ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ පවරනු ලැබූ නඩු කටයුතුවලදී එකී පෙත්සම් පිළිබඳ ලිඛිත නිරීක්ෂණ සකස් කිරීම, පෙරකලාසි සකස් කිරීම සහ අනෙකුත් සියලු ලිපි ලේඛන අදාළ පරිදි සූදානම් කිරීම හා නීතිපතිවරයා සමඟ අදාළ ලිපි ගනුදෙනු කිරීම සිදු කර ඇත. 2022 වර්ෂයේදී මෙම විෂය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ මූලික අයිතිවාසිකම් සම්බන්ධ නඩු කටයුතු 09 ක් සහ අභියාචනාධිකරණයේ පවරනු ලැබූ රිට් පෙත්සම් 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

(18) අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා, අනෙකුත් කාරක සභාවන් මඟින් ඉදිරිපත් කරනු ලබන කාරක සභා වාර්තා හා ඊට අදාළ ලියකියවිලි අවශ්‍ය පරිදි පාර්ලිමේන්තුවේ පිළිගැන්වීමට කටයුතු කර ඇත.

(19) නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සහ දෙවැනි සභාවාර අවසන් කර තිබූ අවස්ථාවන් 02 හිදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කිරීම සඳහා අවශ්‍ය සියලු මූලික කටයුතු කඩිනමින් සිදු කිරීම හා එම කටයුතු සාර්ථකව පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

(20) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටඅමාත්‍යාංශයන්ට ,, අනෙකුත් ආයතනයන්ට සහ මහජනතාවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ විස්තර කඩිනමින් ලබා ගැනීමට හැකිවන පරිදි පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකපාර්ලිමේන්තුවේ රැස්වීම් වෙනුවෙන් ,න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරක , පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර සහ කාර්ය සටහන්ද ,පාර්ලිමේන්තුවේ ඉදිරි රැස්වීම් දිනයන් සඳහා තීරණය වී ඇති සභාවේ වැඩකටයුතු පිළිබඳ තොරතුරුද සිංහල දෙමළ සහ ඉංග්‍රීසි ,භාෂාත්‍රයෙන් සකස් කර පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත .

(21) සියලුම නියෝග, නියමයන්, රෙගුලාසි, ගිවිසුම් සහ යෝජනා සම්මත යනාදී අනු නීති (Subordinate Legislation) පාර්ලිමේන්තුවේදී යථා පරිදි සම්මත කරනු ලැබීමෙන් අනතුරුව ඒවා පිළිබඳව විධිමත් ලෙස අදාළ පරිදි ජනාධිපති ලේකම් හෝ අග්‍රාමාත්‍ය සහ/හෝ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයන්ට ලිඛිතව දැනුම්දී ඇත.

(22) රටේ පවත්නා මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්ද කඩදාසි භාවිතය අවම කිරීමේ පියවරක් ලෙසද, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීමේදී සභාගත කරනු ලබන විවිධ රාජ්‍ය ආයතන මඟින් නිකුත් කරන ලද වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්ය සාධන වාර්තා සහ ගිණුම් වාර්තා මෘදු පිටපත් ආකාරයෙන් පාර්ලිමේන්තු අන්ත: ජාලයට උඩුගත කිරීමට පියවර ගන්නා ලදී.

(23) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ සමබන්ධ විවිධ පාර්ශ්වයන්ට ලිඛිතව සැපයීමට අවස්ථාවෝචිතව අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. ඒ අනුව, 2022 වර්ෂයේදී මෙවැනි තොරතුරු සැපයීම් 30 ක් සිදුකර ඇත.

(24) විවිධ අවස්ථාවලදී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන් මඟින් ඉල්ලා සිටින ලද තොරතුරු අදාළ ලිපි ලේඛන සමඟ එම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. තවද විවිධ අවස්ථාවලදී පොලිස් විමර්ශනවලට අදාළව හා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(25) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ අසුන හිස්වීමේදී 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත 2022 වර්ෂයේදී භාෂාත්‍රයෙන්ම ලිඛිතව දැනුම්දීම සහ ඒ අනුව පාර්ලිමේන්තුවේ අසුන් හිස්වූ

අවස්ථා 03 කදී ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ අභිනවයෙන් තෝරා පත්කරනු ලබන මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට පාර්ලිමේන්තුවේදී දිවුරුම් දීමට හෝ ප්‍රතිඥා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

(26) සභාලේඛන කාර්යාංශය ඇතුළු ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මඟින් පිළියෙල කරනු ලබන සියලුම ලිපිලේඛන සම්බන්ධ කටයුතු සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීමේ (Fully Automated) අරමුණ පෙරදැරි කරගෙන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) අනුග්‍රහය හා මෙහෙයවීම මත ක්‍රියාත්මක කිරීමට නියමිත ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System- DMS) සම්බන්ධ වැඩසටහන සම්පාදනය සඳහා 2022 වර්ෂය තුළදී පවත්වන ලද රැස්වීම්, වැඩමුළු සඳහා සහභාගි වෙමින් සභාලේඛන කාර්යාංශයේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳ අවශ්‍ය තොරතුරු සපයාදීම සහ මගපෙන්වීම මඟින් සක්‍රීයව දායකත්වය ලබාදී ඇත. ඒ සම්බන්ධයෙන් සභාලේඛන අංශයේ අදාළ පරිශීලකයන් සහ ලේඛන කළමනාකරණ පද්ධතියේ (DMS) සම්පාදකයන් සමඟ ප්‍රථම පියවරේ (Iteration-1) පරීක්ෂණ සැසිවාර කිහිපයක් පත්වමින් සක්‍රීය දායකත්වය සපයන ලදි.

(27) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ පාර්ලිමේන්තු සේවා කාලය තහවුරු කරමින් විවිධ ආයතනවලට හෝ අදාළ අයගේ දැනගැනීම පිණිස හෝ සේවා සහතික නිකුත් කිරීම 2022 වසරේදී අවස්ථා 34 කදී සිදු කරන ලදී.

පනත් කෙටුම්පත් කාර්යංශය

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීති සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම පනත් කෙටුම්පත් කාර්යංශයේ මෙහෙවරයි.

ඒ යටතේ පනත් කෙටුම්පත් කාර්යංශය විසින් රජයේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ සිට සම්මත කිරීමෙන් පසුව එම පනත් සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කිරීමෙන් අනතුරුව මුද්‍රණය කිරීම දක්වා සපුරාලිය යුතු වන සියලුම ව්‍යවස්ථාදායකමය පියවරයන්ට අදාළ කටයුතු භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබන්නේය.

එසේම, නව ස්ථාවර නියෝග අංක 52(3) ප්‍රකාරව පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් නීතිපතිවරයා වෙත යොමුකර ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව මතය විමසීමෙන් අනතුරුව ගැසට් මුද්‍රණයේ සිට එම පනත් පාර්ලිමේන්තුවේ දී සම්මත කර මුද්‍රණ කරන තෙක් කටයුතු ද ඒ අයුරින්ම භාෂාත්‍රයෙන්ම ඉටු කරනු ලබයි.

ඒ අනුව, 2022 වර්ෂය තුළ දී,

1.	පනත් කෙටුම්පත් කාර්යංශය වෙත ලැබුණු රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව	46
2.	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව	43
3.	පනත් කෙටුම්පත් කාර්යංශය විසින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලද රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව	43
4.	ඉල්ලා අස්කර ගනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව	00
5.	පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ රජයේ පනත් කෙටුම්පත් සංඛ්‍යාව	46
6.	ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කළ රජයේ පනත් සංඛ්‍යාව	46

ඉහත වර්ෂය තුළ දී ම,

1.	පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරිමට අදාළව පනත් කෙටුම්පත් කාර්යංශය වෙත ලැබුනු ඉල්ලීම් සංඛ්‍යාව	32
2.	ස්ථාවර නියෝග 52(3) ප්‍රකාරව නීතිපතිවරයා වෙත යොමු කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව	30
3.	මුද්‍රණය කිරීම පිණිස පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් රජයේ මුද්‍රණාලය වෙත යොමු කරන ලදුව මුද්‍රණය කරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව	20
4.	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ගැසට් සංඛ්‍යාව	19
5.	අමාත්‍ය වාර්තා ලබා ගැනීම පිණිස අමාත්‍යාංශ වෙත යවන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව	17
6.	ඉල්ලා අස්කර ගනු ලැබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව	01
7.	පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව	02
8.	ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් සංඛ්‍යාව	02

මෙයට අමතරව, පහත සඳහන් කාර්යයන්ද පනත් කෙටුම්පත් කාර්යාංශය මඟින් 2022 වර්ෂය තුළදී සිදු කරන ලදී.

(අ) රජයේ පනත් කෙටුම්පත් හා සම්බන්ධව පවත්වන ලද අමාත්‍යාංශ උපදේශක කාරක සභා සහ රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභා රැස්වීම් සඳහා පනත් කෙටුම්පත් කාර්යංශයේ නිලධාරීන් සහභාගී වී අවශ්‍ය දායකත්වය ලබා දීම;

(ආ) පාර්ලිමේන්තු අන්ත:ජාලයේ ඇති ව්‍යවස්ථාදායක සේවා තොරතුරු පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා මහජනතාවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට භාෂාත්‍රයෙන්ම ලබා ගැනීමට හැකිවනු පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම;

(ඇ) පනත් කෙටුම්පත්වලට අදාළව ව්‍යවස්ථාදායක සේවා තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම;

(ඈ) 2022 වර්ෂයේ සම්මත වූ සියලුම පනත් ගොනුකොට පොතක් වශයෙන් බැඳීමට අවශ්‍ය කටයුතු සැලසීම;

(ඉ) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ බාහිර පාර්ශ්වයන් විසින් පනත් කෙටුම්පත් කාර්යංශයට අදාළව ඉල්ලා ඇති තොරතුරු පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරී වෙත ලබා දීමට කටයුතු කිරීම;

(ඊ) ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යවරුන් සහ වෙනත් විවිධ ආයතනයන වෙතින් ලද ඉල්ලීම් මත පනත් කෙටුම්පත්/පනත් පිළිබඳව සහ ඒවා සම්මත කිරීමේ ක්‍රියාදාමයන්ට අදාළව තොරතුරු ලබාදීම;

(උ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දු එක් රැස් කර, සකස් කර පොතක් ලෙසින් මුද්‍රණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම; සහ

(ඌ) විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීමේ ක්‍රියාවලියට දායක වීම සහ එම සංශෝධනයන් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග ඒකාබද්ධ කිරීමේ කටයුතු සිදු කර එය මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම;

පනත් කෙටුම්පත් කාර්යාංශය මගින් සිදු කරන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යාංශය

2022 වර්ෂයේදී පවත්වන ලද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සම්බන්ධ විස්තර

නවවන පාර්ලිමේන්තුවේ දෙවන සභාවාරයේදී පැවැත්වූ කාරක සභා

	පැවති කාරක සභාව	පැවති දිනය	පැවැති කාරක සභා සංඛ්‍යාව
1	නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.07.05	1
2	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.06.09 2022.07.06	2
3	විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.11	1
4	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.25	1
5	අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.09	1
6	සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.22	1
7	කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.02.23 2022.06.10	2
8	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.02.22	1
9	කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.02.22 2022.06.10	2
10	වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.24	1
11	වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.02.10	1
12	විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.06.07	1
13	ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.25	1
14	ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.24	1
15	සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.02.23 2022.03.11	2
16	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.04	1
17	තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.03.08	1
පැවති මුළු කාරක සභා රැස්වීම් සංඛ්‍යාව			21

නවවන පාර්ලිමේන්තුවේ තෙවන සභාවාරයේදී පැවැත්වූ කාරක සභා

	පැවති කාරක සභාව	පැවති දිනය	පැවැති කාරක සභා සංඛ්‍යාව
1	ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.23	1
2	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.16	1
3	තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.30	1
4	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.10	1
5	වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.20	1
6	ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.15	1
7	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.08 2022.11.24	2
8	ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.21 2022.11.29	2
9	අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.08	1
10	ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.16	1
11	ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.16	1
12	සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.23	1
13	ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.17	1
14	කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.20	1
15	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.15	1
16	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.22 2022.10.04 2022.10.18 2022.10.18 2022.11.08 2022.11.21 2022.12.13	7
17	සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.30	1
18	වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.25	1
19	කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.16	1
20	නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.22	1
21	විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.10	1
22	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.10.22	1
23	විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.10.04	1
24	පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.12.06	1
25	ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.22	1
26	වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.11.23	1
27	කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.09.07	1
28	මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.10.20	1
29	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	2022.10.21 2022.12.05	2
	පැවති මුළු කාරක සභා රැස්වීම් සංඛ්‍යාව		38

නවවන පාර්ලිමේන්තුවේ දෙවන සභාවාරය

කාරක සභාව	අමාත්‍යාංශය වෙත යොමු කරන ලද යෝජනා සංඛ්‍යාව	ලද වාර්තා සංඛ්‍යාව
ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	09	08
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	24	16
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	06	-
නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	34	34
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	-
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	20	06
අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	28	28
සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	11	08
කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	04	-
පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	06	06
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	05	01
කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	-
වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	-
වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	01
ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	03
විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	-
වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	04	-
ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	01
සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	14	04
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	01
කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	01
ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	02
මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	11	03
එකතුව	**198**	**123**

නවවන පාර්ලිමේන්තුවේ තෙවන සභාවාරය

කාරක සභාව	අමාත්‍යාංශය වෙත යොමු කරන ලද යෝජනා සංඛ්‍යාව	ලද වාර්තා සංඛ්‍යාව
ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	-
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	-
තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	01
වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	06	02
ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	01
අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	05	04
ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	-
ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	-
සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	03	02
ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	01
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	02
වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	01
කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	01
නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	08	04
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	02
පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	-
වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	01
කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	01	-
මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	02	-
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව	-	-
එකතුව	**49**	**22**

කාරක සභා කාර්යාංශය

2022 වර්ෂය තුල කාරක සභා කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වූ මුළු කාරක සභා සංඛ්‍යාව 24 ක් වන අතර ඒ පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පහත දැක්වේ.

	කාරක සභාව	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	සළකා බැලීම් සංඛ්‍යාව				පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරන ලද වාර්තා
			පනත් කෙටුම්පත්	නියමයන්/ නියෝග	යෝජනා/ පරිපූරක ඇස්තමේන්තු	වාර්ෂික/කාර්යසාධන වාර්තා	
1	**රජයේ මුදල් පිළිබඳ කාරක සභාව** *සභාපති - ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා* • *2023 වර්ෂයේ අයවැය සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 121(5)(i) සහ 121(5)(ii) අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තා 2 ඉදිරිපත් කරන ලදී*	30	11	61	16	-	23
2	**තේරීම් කාරක සභාව** සභාපති - කථානායක, ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා	18	අදාළ නැත				
3	**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව** සභාපති - කථානායක,ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා	6	අදාළ නැත				3
4	ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව (සභාපති - ගරු තාරක බාලසූරිය මහතා)	8	අදාළ නැත				-
5	ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරණු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව	8	අදාළ නැත				-
6	2021 දෙසැම්බර් 03 සහ 04 දිනයන්හි පාර්ලිමේන්තු සභා ගර්භයේදී සහ පාර්ලිමේන්තු පරිශ්‍රය තුළදී සිදුවූ සිද්ධීන් පිළිබඳව සොයා බලා ඒවාට ගත යුතු පියවර කවරේද යන්නත්, ඉදිරියේදී එවැනි සිද්ධීන් ඇති නොවීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිර්දේශ කිරීමටත් හැකිවන පරිදි පත් කරන ලද විශේෂ කාරක සභාව	3	අදාළ නැත				1

<table>
<tr><td>7</td><td>මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව</td><td>4</td><td colspan="2">අදාළ නැත</td><td>1</td></tr>
<tr><td>8</td><td>පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය</td><td>6</td><td colspan="2">අදාළ නැත</td><td></td></tr>
<tr><td>9</td><td>පාර්ලිමේන්තු ළමා සංසදය</td><td>5</td><td colspan="2">අදාළ නැත</td><td></td></tr>
<tr><td rowspan="3">10</td><td rowspan="3">උසස් නිලතල පිළිබඳ කාරක සභාව
සභාපති - කථානායක, ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා</td><td rowspan="2">පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව</td><td colspan="3">නිෂ්කාශිත පත්වීම් සංඛ්‍යාව</td></tr>
<tr><td>කථානායක/ මහකොමසාරිස් පත්වීම්-</td><td>අමාත්‍යාංශ ලේකම් පත්වීම් -</td><td>ආයතන සභාපති පත්වීම්</td></tr>
<tr><td>7</td><td>15</td><td>27</td><td>8</td></tr>
</table>

<u>රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශය</u>

2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වසර තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉටු කරන ලද කාර්යයන්වල ප්‍රගතිය

අනු අංකය	**යෝජිත ක්‍රියාකාරකම**	**අපේක්ෂිත ඉලක්කය**	**ප්‍රගතිය**	**ප්‍රගතියේ ප්‍රතිශතය**	**වෙනත් කරුණු**
1	විගණකාධිපති වාර්තා විමර්ශනය කිරීම සහ කාලීන හා විශේෂ වැදගත්කමකින් යුත් කරුණු සාකච්ඡා කිරීම සඳහා කාරක සභා රැස්වීම් පැවැත්වීම.	කාරක සභා රැස්වීම් 60	පවත්වන ලද කාරක සභා රැස්වීම් සංඛ්‍යාව 38	63%	පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම නිසා 2022 වර්ෂය තුළ අවස්ථා දෙකකදී කාරක සභාව අහෝසිවීම හා රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් කාරක සභාවේ තීරණය පරිදි රුස්වීම් කල් දැමීමට සිදුවීම හේතුවෙන් අපේක්ෂිත කාරක සභා රුස්වීම් ප්‍රමාණය පැවැත්වීමට නොහැකි විය.

2	2020 මූල්‍ය වර්ෂයට අදාළවල 844 ක් පමණ වූ රාජ්‍ය ආයතනවල මූල්‍ය හා කාර්ය සාධනය මාර්ගගත ක්‍රමයට ඇගයීම.	අදාළ දත්ත එක්රැස් කිරීම හා වාර්තා සකස් කිරීම	2020 මූල්‍ය වර්ෂය සඳහා සියලුම ඇගයීම් කටයුතු අවසන් කර වාර්තා සකස් කර ඇත.	100%	
3	කාරක සභා වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම	3	3	100%	
4	කාරක සභා වාර්තාවලට අදාළ පසුවිපරම් කටයුතු	පසුවිපරම් කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ වෙත කාරක සභා වාර්තා යොමු කිරීම.(කාරක සභා වාර්තාවල සඳහන් කරුණු පිළිබඳ අදාළ අමාත්‍යාංශ විසින් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ.)	සියලුම වාර්තා පසුවිපරම් කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කර ඇත. අමාත්‍යාංශ කීපයක් විසින් සිය නිරීක්ෂණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.	100%	පසුගිය වසර තුළ අවස්ථා දෙකකදී කාරක සභාව අහෝසිවී තිබීම හේතුවෙන් වාර්තා සභාගත කිරීම ප්‍රමාද වීම නිසා ඇතැම් අමාත්‍යාංශවල නිරීක්ෂණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත.
5	විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම	විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන සියළුම වාර්තා පාර්ලිමේන්තුව හමුවේ සභාගත කොට එක් එක් වාර්තාව සඳහා පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක ලබා දීම.	ලද සියලුම වාර්තා සභාගත කර පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක ලබා දී ඇත.	100%	
6	පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම	කාරක සභා පිළිබඳ විනිවිදභාවය සහතික කරනු වස් සහ මහජන අදහස් ලබා ගැනීමේ අරමුණෙන් කාරක සභාව හමුවට ඉදිරියේදී කැඳවන ආයතනවල නම්, කැඳවන දිනය හා වේලාව පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කිරීම	කාරක සභාවට කැඳවන ලද සියලුම ආයතන පිළිබඳ අදාළ තොරතුරු වෙබ් අඩවියේ පළ කර ඇත.	100%	

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

	ක්‍රියාකාරකම	ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
01	• අදාළ අමාත්‍යාංශ/ රජයේ හිමිකාරිත්වය සහිත ව්‍යාපාර සහ අනෙකුත් අදාළ ව්‍යාපෘති සමග සම්බන්ධීකරණය • අදාළ ආයතන සහ ව්‍යාපෘති,කාරක සභාව ඉදිරියට කැඳවීම	100% 77.94% (රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් අදාළ ආයතන මගින් ඔවුන්ගේ කැඳවීම් කල් දමන ලෙස කරන ලද ඉල්ලීම් නිසා මෙහි ප්‍රගතිය සුළු ප්‍රමාණයකින් අඩුවිය.
02	• තොරතුරු සාරාංශගත කිරීම • කාර්ය සටහන් (Minutes) සැකසීම • වාර්තා සැකසීම • කමිටුවට කරුණු ඉදිරිපත් කිරීම • මූලික සාකච්ඡා (pre-discussions) • පසු විපරම් (follow ups) කිරීම	100% 100% 100% 100% 100% 100%
03	• අවශ්‍ය අවස්ථාවලදී ක්ෂේත්‍ර චාරිකා (field visits) සිදු කිරීම	ක්ෂේත්‍ර චාරිකා යාමේ අවශ්‍යතාවයක් මතු වූයේ නැත.

මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස පහත පරිදි වේ.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ ක්‍රියාකාරකම්	**අපේක්ෂිත ඉලක්කයෙන් 2022 වසරේදී ලබා කරගත් ප්‍රතිඵලය ප්‍රතිශතයක් ලෙස (%)**		
	95	85	75
කාරක සභා කාර්යාංශයට පෙත්සම් ලැබීම හා ඒවා පාර්ලිමේන්තුවට පිළිගැන්වීම	√		
පෙත්සම්කරුවන්, කාරක සභා සාමාජිකයන්, ඔම්බුඩ්ස්මන් සහ අනෙකුත් රජයේ ආයතන සමඟ සම්බන්ධවීම		√	
පෙත්සම්කරුවන් සහ රාජ්‍ය ආයතන කාරක සභාව හමුවට කැඳවීම		√	
කරුණු සාරාංශගත කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම, කාරක සභාවට කරුණු ඉදිරිපත් කිරීම හා කාරක සභා නිර්දේශ පසු විපරම් කිරීම	√		

පෙත්සම් කාරක සභාවට පෙත්සමක් ලැබීමෙන් පසු එම පෙත්සම විමර්ශනය කිරීම දක්වා කටයුතු සිදු කිරීම පෙත්සම් කාරක සභා කාර්යාංශයට පැවරෙන වගකීමක් වුවත්, පෙත්සමට අදාළ අමාත්‍යාංශ වාර්තා ලබාගැනීම, එම වාර්තාවට අදාළ පෙත්සම්කරුගේ අදහස් ලබාගැනීම ආදී කටයුතු ඒ ඒ අදාළ පාර්ශවයන් වෙත පැවරෙන වගකීම් වන බැවින් ඇතැම් විට එම වාර්තා ඔවුන්ගෙන් ලබාගැනීම සඳහා කාර්යාංශයට දීර්ඝ කාලයක් ගතවන අවස්ථා ඇත. එබැවින්, 2020 හා 2021 වසරවලදී ලැබුණු ඇතැම් පෙත්සම් විමර්ශනය කරනු ලැබුයේ 2022 වසරේදී වේ.

2022 වසරේ කාරක සභාව රැස්වූ වාර ගණන	30
කාරක සභාව විසින් සලකා බලා ඇති පෙත්සම් ගණන	*283

(2020 වසරේදී ලැබුණු පෙත්සම් 134, 2021 වසරේදී ලැබුණු පෙත්සම් 143 හා 2022 ලැබුණු පෙත්සම් 6 සලකා බලා ඇත)

*- 2022 වසරේදී රටේ පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හමුවේ ඇතිවූ කලබලකාරී වාතාවරණය නිසා කාරක සභා රැස්වීම් 06 ක පමණ ප්‍රමාණයක් අවලංගු කිරීමට සිදු විය. තවද, 2022.07.28 සිට 2022.08.03 දක්වා කාලසීමාව තුළ පාර්ලිමේන්තුව වාර අවසාන කර තිබූ අතර නවවැනි පාර්ලිමේන්තුවේ තෙවන සභාවාරය සඳහා කාරක සභාවට සභික මන්ත්‍රීවරුන් පත්කිරීම සිදුවූයේ 2022.08.27 දිනය. ඒ අනුව, එම කාලසීමාව ඇතුළතදීත් කාරක සභා රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. එබැවින්, 2022 වසර තුළදී කාරක සභාව විසින් විමර්ශනය කිරීමට බලාපොරොත්තු වූ සම්පූර්ණ පෙත්සම් සංඛ්‍යාව 80 කින් පමණ අඩු විය.

කථා පරිවර්තක කාර්යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තු කථා පරිවර්තක කාර්යාලයෙන් සපයන ලද සේවාවන් පහත පරිදි වේ.

(i) පාර්ලිමේන්තු රැස්වීම් දිනවලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහා ගර්භය තුළ සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(ii) ජාතික සභාවේ සහ උපදේශක කාරක සභා රැස්වීම්වලදී මෙන්ම කාරක සභා කාමරවල පවත්වන ලද වෙනත් රැස්වීම්වලදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ නිලධාරීන් සහ කාරක සභාවලට සහභාගී වන විවිධ නිලධාරීන් සඳහා සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(iii) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්, පෙත්සම් පිළිබඳ කාරක සභා රැස්වීම් සහ සමගාමී කථා පරිවර්තන පහසුකම් නොමැති කාරක සභා කාමරවල පවත්වන ලද රැස්වීම්වලදී දෙමළ භාෂාව කථා කරන මන්ත්‍රීවරුන්ට සමීපස්ථ කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(iv) සූම් තාක්ෂණය භාවිත කරමින් පැවති විවිධ කාරක සභා සඳහා සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම.

(v) පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ පළකරනු ලබන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, වාචික නොවන පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සහ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් විමසනු ලබන ප්‍රශ්න සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම. 2022 වර්ෂය තුළදී එක් එක් අංශය විසින් පරිවර්තනය කරන ලද ඉහත සඳහන් සියලුම ආකාරවලට ඇතුලත් ප්‍රශ්න සංඛ්‍යාව මතු කියැවෙන පරිදි වේ.

අංශය	ප්‍රශ්න සංඛ්‍යාව
සිංහල/ඉංග්‍රීසි	697
සිංහල/දෙමළ	621
දෙමළ/ඉංග්‍රීසි	01

2022 වර්ෂය තුළදී සභා ලේඛන කාර්යාලය, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පෙත්සම් කාරක සභාව, උපදේශක කාරක සභා, මුදල් කමිටුව, වේත්‍රධාරී දෙපාර්තමේන්තුව, ආයතන කාර්යංශය, ගරු කථානායකතුමාගේ කාර්යාලය සහ පාර්ලිමේන්තුවේ වෙනත් කාර්යංශ වෙතින් පරිවර්තනය සඳහා මෙම කාර්යාලයට යොමු කරන ලද රාජකාරි ලිපි ලේඛන රාශියක් සිංහල/ඉංග්‍රීසි, සිංහල/දෙමළ, දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කරන ලද අතර එක් එක් අංශය විසින් පරිවර්තනය කරන ලද පිටු සංඛ්‍යාව පහත පරිදි වේ.

අංශය	පරිවර්තන පිටු සංඛ්‍යාව
සිංහල/ඉංග්‍රීසි	895
සිංහල/දෙමළ	619
දෙමළ/ඉංග්‍රීසි	440

<u>පුස්තකාලය</u>

පසුගිය වසරේ ස්ථාපනය කරන ලද කොහා දත්ත කළමනාකරණ පද්ධතියට මාරු කරන ලද දත්ත (data transferred) පරීක්ෂා කිරීමෙන් පසු එම දත්ත පද්ධතියට ඇතුළත් නොවූ පොත් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කරන ලදි. මුළු පොත් එකතුවම තීරු කේතකරණය (Bar-coding) අවසන් කරන ලද අතර පොත් එකතුවේ සිංහල පොත් වල දත්ත සංස්කරණය හා ඒවායේ පිට කවර අනුරූප (images) ඇතුළත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

DMS ව්‍යාපෘතියේ දත්ත විශ්ලේෂණය පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් තවදුරටත් සිදු කරමින් පවතින අතර ඒ සඳහා සහාය වීමට ආයතන අංශය මගින් පුහුණු පදනම මත අනුයුක්ත කරන ලද නිලධාරිනියකගේ සේවය දැනටත් ලබා ගනිමින් පවතී. පුස්තකාල ප්‍රකාශන එකතුව ඩිජිටල්කරණ වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රකාශන ඩිජිටල් ප්‍රතිරූප (image) එක් කර ප්‍රකාශන ලෙස සැකසීමේ කාර්යය තවදුරටත් සිදු කරමින් පවතී. සකස් කරන ලද පනත් මෘදු පිටපත් (PDF පිටපත්) පාර්ලිමේන්තු වෙබ් අඩවියට උඩුගත (upload) කිරීමේ කටයුතු දැනට සිදු කරමින් පවතී.

2022 වසර තුල පාර්ලිමේන්තු පුස්තකාල එකතුවට අලුතින් එක් කර ගන්නා ලද ප්‍රකාශන ප්‍රමාණය

පොත්	34
පුවත්පත්	26 (වර්ග)
වාර සඟරා වර්ග	12 (වර්ග)

රටේ පවතින ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කර ගන්නා ලද්දේ ගරු මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන ලද සහ අත්‍යාවශයෙන්ම පුස්තකාලයේ තිබිය යුතුයැයි සිතන ග්‍රන්ථ කිහිපයක් පමණකි. පුස්තකාල එකතුවට මිලදී ගන්නා වාර සඟරා කිහිපයක් පවතින දුෂ්කරතා හමුවේ ඒවා ලබා දෙන නියෝජිතයන් විසින්ම සැපයීම නවතා දමා ඇත. වාර සඟරා කිහිපයක් මුද්‍රණය කිරීම නවතා ඩිජිටල් පිටපත් පමණක් නිකුත් කිරීමට පටන් ගෙන ඇති අතර ඒවායේ දායක මුදල ද ප්‍රමාණාත්මකව වැඩි වන බැවින් පුස්තකාලයට ප්‍රතිග්‍රහණය නවතා දමන ලදි.

පුස්තකාලය තුළ පොත්පත් ගබඩා කිරීමේ ඉඩ පහසුකම් ඉතා සීමිත වෙමින් පවතින බැවින් ඊට පිළියම් ලෙස පුස්තාකලයට මිලදී ගන්නා දිනපතා සහ සති අග පුවත්පත් කිහිපයක මෘදු පිටපත් නොමිලේ ලබා ගැනීමේ හැකියාව සොයා බැලිණි. ඒ අනුව දිනපතා මව්බිම, ඉරිදා මව්බිම, Ceylon Today (daily), Ceylon Today (Weekend), දිනමිණ සහ Daily News පුවත්පත් වල මෘදු පිටපත් ලබා ගෙන එම පුවත්පත් ස්ථිර බැඳුම්කරණය නවතා දමන ලද අතර මිලදී ගන්නා පිටපත් ප්‍රමාණය ද අඩු කෙරිණි. ප්‍රකාශිත රජයේ ගැසට් පිටපත් 2022 සැප්තැම්බර් මස සිට මෘදු පිටපත් බාගත කිරීමෙන් ඩිජිටල් එකතුවක් ගොඩ නගන බැවින් එම මස සිට ඉදිරියට ගැසට් ගොනු බැඳුම්කරණය කිරීම නවතා දැමීමේ හැකියාව ලැබිණි.

පුස්තකාලයේ බැහැර දීමේ අංශයෙන් පොත් 440 ක් 2022 වසර තුළ බැහැර දී ඇත. පාර්ලිමේන්තු විවාදයන්ට අවශ්‍ය කරුණු සැපයීමේදී ගරු මන්ත්‍රීවරුන්ට තොරතුරු ගොනු 1350 කට ආසන්න ප්‍රමාණයක් සකසා දී ඇත.

දිනපතා ජාතික පුවත්පත් හා සඟරා වල පළ කෙරුණු කාලීන සිදුවීම් වලට අදාළ වාර්තා 3800 කට අධික ප්‍රමාණයක් එදිනෙදා පාර්ලිමේන්තු විවාදයන් වෙනුවෙන් පරිශීලනය සඳහා ඡායාපිටපත් ලබා දීම, මාර්ගගතව ලබා දීම හෝ ස්කෑන් පිටපත් ලබා දීම සිදු විය.

මීට අමතරව හැන්සාඩ් වාර්තා, පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා, කෙටුම්පත්, පනත්, ගැසට් නිවේදන, අමාත්‍යාංශ කාර්ය සාධන වාර්තා යන ප්‍රකාශනයන්හි තොරතුරු ආශ්‍රයෙන් සකස් කරන ලද වාර්තා 300 කට ආසන්න ප්‍රමාණයක් පසුගිය වසර තුළ සකස් කර ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දිණි.

විශේෂ තොරතුරු අවශ්‍යතා ලෙස කථානායක කාර්යාලය, නියෝජ්‍ය කථානායකතුමා, තොරතුරු දැන ගැනීමේ කාර්යාලය - පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය, සභානායක කාර්යාලය, විපක්ෂ නායක කාර්යාලය, අධිකරණ අමාත්‍යාංශය, නීති පති දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු, නීති කෙටුම්පත් කාර්යාලය, අධිකරණ සේවා කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අනෙකුත් ආයතනයන්ට තොරතුරු ගොනු 130 ක් පමණ සපයන ලදි.

පුස්තකාලයේ හඳුනා ගන්නා ලද නැවත සංරක්ෂණයට භාජනය කල යුතු ප්‍රකාශන පාර්ලිමේන්තුව පොත් බැඳුම් අංශය වෙතින් සකස් කර ගැණිනි. සන බැම්ම සහිතව සැකසීමට නීති කෙටුම්පත් ප්‍රකාශන කොටස් වශයෙන් රාජ්‍ය මුද්‍රණාලයට යැවීම සිදු කරයි.

මෙවරද 2023 වසර සඳහා පාර්ලිමේන්තු දිනපොත සැලසුම් කර සම්පාදනය කරන ලද අතර, රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කරවා ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා, ගරු කාරක සභා සභාපතිතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සමස්ත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය සහ අනුබද්ධ අනෙකුත් කාර්ය මණ්ඩල අතර බෙදා හරින ලදි.

පුස්තකාලයේ පර්යේෂණ අංශයේ 2022 වසරේ කාර්යසාධනය:

ඇගයුම් නිර්ණායකය	මුළු ගණන
මන්ත්‍රීවරුන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම (Information Requests)	950
සකසන ලද පර්යේෂණ ලේඛන	
• ව්‍යවස්ථා සංශෝධන, පනත් කෙටුම්පත්, රෙගුලාසි සඳහා පසුබිම් පත්‍රිකා (Background Papers)	92
• තොරතුරු සටහන් (Information Notes)	113
• පර්යේෂණ පත්‍රිකා (Research Papers)	6
• කෙටි පර්යේෂණ පත්‍රිකා (Research Briefs)	26
• දත්ත පත්‍රිකා (Fact Sheets)	45
පාර්ලිමේන්තු කාරක සභා යනාදියට දත්ත සැපයීම ඇතුළු වෙනත් සේවාවන්	
• තොරතුරු සැපයීම (Provision of Information)	31
• සහභාගී වීම (Participation)	28
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, සම්මේලන යනාදිය සඳහා සහභාගී වූ කථානායකතුමා, මන්ත්‍රී කණ්ඩායම් හා මහලේකම් කාර්යාලය සඳහා පිළියෙල කරන ලද ලේඛන	
• කතා (Speeches)	30
• කතා සඳහා අවශ්‍ය තොරතුරු (Talking Points)	26
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, සම්මේලන යනාදිය සඳහා සහභාගී වීම (International Conferences/Workshops/Training Programmes)	1
දේශීය සම්මන්ත්‍රණ, සම්මේලන යනාදිය සඳහා සහභාගී වීම (Local Conferences/Workshops/Training Programmes)	6
වෙනත් සේවාවන් (Other)	
• ඉදිරිපත් කිරීම් (Presentations)	1
• ආරාධිත දේශන (Guest Lectures)	1
• වාර්තා සැකසීම් (Reports)	1

වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

විෂයය	ක්‍රියාකාරකම	වසර තුල අත්කරගත් ප්‍රගතිය 2022 (%)	අපේක්ෂිත ප්‍රගතිය අත්කර නොගැනීමට හේතුව
උත්සව කටයුතු	i. පාර්ලිමේන්තු සංකීර්ණයේ සියලුම උත්සව, ජාතික සහ ආගමික කටයුතු සංවිධානය කිරීම, පැවැත්වීම සහ ගරු කථානායකතුමා වෙනුවෙන් රාජ්‍යතාන්ත්‍රික කටයුතු සම්බන්ධ කරුණු නියෝජනය කිරීම. ii. ප්‍රභූ සහ අනෙකුත් විදේශ නියෝජිතයින් පාර්ලිමේන්තුව වෙත පැමිණෙන විට ඔවුන් පිළිගැනීම සහ පහසුකම් සැලසීම. iii. රාජ්‍ය අනුග්‍රහය සහිත අවමංගල්‍ය උත්සව සිදුකිරීම/ආලේඛ්‍ය චිත්‍ර නිරාවරණය කිරීම.	100% 85% --	 කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පැමිණෙන පිරිස් සීමා විය. මෙම වර්ෂයේ මෙවන් අවස්ථාවන් නොවීය.
ආගන්තුකයන් සම්බන්ධ කටයුතු කළමනාකරණය සහ ගැලරි පාලනය.	පාර්ශවකරුවන්ට සහය වීම සහ මහජනතාව සම්බන්ධ කටයුතු නියාමනය සහ ගැලරි පාලනය කිරීම.	60%	කොවිඩ් 19 වසංගත තත්ත්වය මත වසරේ මුල් කාර්තු 2 හිදී සීමා විය.
ආරක්ෂාව .	i. ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට සහාය වීම සහ සභා ගර්භයේ ක්‍රියාවලිය ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තු සංකීර්ණයේ සහ පිටත පරිශ්‍රය තුළ දැඩි ආරක්ෂාවක් පවත්වාගෙන යාම. ආරක්ෂාව සම්බන්ධ කරුණු ගරු කථානායකවරයා වෙත ඉදිරිපත් කිරීම. ii. යාවත්කාලීන කර ඇති තර්ජන විශ්ලේෂණයන්ට මුහුණ දීම සඳහා ආරක්ෂක පද්ධති/විධිවිධාන අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම. iii. වසර සඳහා සැලසුම් කර ඇති පරිදි ආරක්‍ෂක නිලධාරීන්, සැපයුම්කරුවන්, මන්ත්‍රී රියදුරන් ඇතුළු පාර්ලිමේන්තු/ අනුබද්ධ / අනෙකුත් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ආරක්‍ෂක නිෂ්කාශන ක්‍රියාවලිය iv. පුපුරණ ද්‍රව්‍ය ඇතුළු ගිනි නිවීමේ පුහුණු, ගිනි නිවීමේ අභ්‍යාස සහ වැඩමුළු පැවැත්වීම. v. යතුරු පරිපාලනය. vi. පවතින සම්පත් භාවිතා කරමින් X කිරණ පරීක්ෂණ සිදුකිරීම ..	100% 95% 100% 100%	 සමහර වැඩිදියුණු කිරීම් මිල අධික බව හා ප්‍රතිපාදන මත සීමාකාරී විය. කොවිඩ් 19 වසංගත තත්ත්වය මත නොපැවැත්විනි.

සභා ගර්භය	'සෙංකෝලයේ' භාරකාරත්වය ඇතුළුව, සභා ගර්භ සහායක සේවා. සභා ගර්භයේ ආසන වෙන් කිරීම, මන්ත්‍රී ජ්‍යෝෂ්ඨතා ලැයිස්තු පවත්වාගෙන යාම, පැමිණීම වාර්තා කිරීම, විනය පවත්වාගෙන යාම සහ ගරු කථානායකතුමාගේ නියෝග ක්‍රියාත්මක කිරීම.	100%	
ඉඩපහසුකම් සැලසීම	පාර්ලිමේන්තු සංකීර්ණයේ හමුවීම් කාමර, පක්ෂ කාර්යාල, කමිටු කාමර, අමාත්‍යවරුන්ගේ කාමර සහ කාර්යාල අවකාශයන් හා අදාළ පහසුකම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වසර සඳහා කරන ලද ඉල්ලීම අනුව වෙන් කිරීම. ගෘහ භාණ්ඩ සහ උපාංග සුරක්ෂිතව තබා ගැනීම.	100%	
අවසර පත්‍ර	මන්ත්‍රී, කාර්ය මණ්ඩල හැඳුනුම්පත්, නිලධාරීන්ගේ අවසර පත්‍ර, ගැලරි අවසර පත්‍ර සහ විද්‍යුත් උපකරණ සඳහා අවසර පත්‍ර ඇතුළුව ගොඩනැගිල්ලට සහ පාර්ලිමේන්තු සංකීර්ණයට අදාළ සියලුම ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම.	100%	
සේවා/සුභසාධන	i. දුරකථන සේවා, පිළිගැනීමේ සේවා පවත්වාගෙන යාම, ii. ගෘහභාණ්ඩ ඔප දැමීමේ කටයුතු, iii. ලිපි සහ ප්‍රවෘත්ති පත්‍ර වර්ග කිරීම සහ බෙදා හැරීම, iv. කාර්ය මණ්ඩල නිල ඇඳුම් පිරිසිදු කිරීම. v. මන්ත්‍රීවරුන් සඳහා විවේක කාමර පහසුකම් සැලසීම vi. මන්ත්‍රීවරුන්/කාර්ය මණ්ඩලය සඳහා ලොකර්/කබඩ් පහසුකම් සැපයීම	100% 90% 100% 90% 100% 100%	පවතින ආර්ථිකමය තත්ත්ව යටතේ නිසි වේලාවට අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාවය අදාල සේවා සපයන්නන්ගේ දුර්වලතා
තොරතුරු සහ ප්‍රකාශන	i. පාර්ලිමේන්තු වෙබ් අඩවියේ දෙපාර්තමේන්තුවට අදාළ දත්ත යාවත්කාලීන කිරීම, මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ පින්තූර පාර්ලිමේන්තු වෙබ් අඩවියට සහ අන්තර්ජාලයට උඩුගත කිරීම. ii. වේත්‍රධාරී කාර්යාලයේ ප්‍රකාශන, එහි ඉතිහාසය සහ මෙහෙවර, අරමුණු සහ කාර්යයන් සිදුකිරීම සහ ඒවා සමාලෝචනය කර යාවත්කාලීන කිරීම	100% 100%	
පුරාවිද්‍යාත්මක/ ඓතිහාසික අරමුණු නිරූපණය කෙරෙන භාණ්ඩ අලෙවිය	පාර්ලිමේන්තු සිහිවටන භාණ්ඩ අලෙවිසැල සහ චිත්‍ර, බිතුසිතුවම්, ලී, රිදී සහ රන් කැටයම් ඇතුළු ප්‍රදර්ශන මධ්‍යස්ථානය ආශ්‍රිත කටයුතු පාලනය කිරීම සහ නියාමනය කිරීම.	90%	පවත්න ආර්ථිකමය තත්ත්ව යටතේ අලෙවිය සඳහා අරමුණුගත භාණ්ඩ සපයා ගැනීමේ අපහසුතා

දෙපාර්තමේන්තු-මය	i. කාර්ය මණ්ඩල රැස්වීම් සඳහා පහසුකම් සැලසීම, ආරක්ෂාව සම්බන්ධ රැස්වීම් අවශ්‍ය පරිදි පැවැත්වීම. ii. පාර්ලිමේන්තු සංකීර්ණය අවට විවිධ ඉදිකිරීම් අනුමත කිරීම ආශ්‍රිත රාජකාරි iii. සියලුම කාර්ය මණ්ඩල සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා පහසුකම් සැලසීම. මුළු කාර්ය මණ්ඩලය 140.	100% 100% 100%	

පරිපාලන දෙපාර්තමේන්තුව

පරිපාලන දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්යාංශ වලින් සමන්විත වේ.

1. ආයතන කාර්යාංශය
2. මන්ත්‍රී සේවා කාර්යාංශය
3. මානව සම්පත් සංවර්ධන අංශය
4. ප්‍රවාහන කාර්යාංශය
5. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ඒකකය

එම කාර්යාංශයන් විසින් ඉටු කරන ලද ප්‍රධාන සේවාවන් පහත පරිදි වේ.

ආයතන කාර්යාංශය

පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කාර්යක්ෂම හා ප්‍රතිඵලදායක බවට පත්කරලීමේ කාර්ය උදෙසා මානව සම්පත් ක්‍රියාකාරකම් අධීක්ෂණ තත්ත්වයෙන් පාලනය කිරීම ආයතන කාර්යාංශයේ ප්‍රධාන වගකීමයි. ඒ සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම් වැනි ආයතනික කාර්යයන් මෙන්ම සියළුම කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම සිදු කරයි.

2022 වර්ෂය තුළ ආයතන අංශයේ ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව පහත සඳහන් පරිදි වේ.

ක්‍රියාකාරකම්	සැලසුම් කළ ප්‍රමාණය	ඉටු කල ප්‍රමාණය	කාර්ය සාධනය (%)	සටහන
බඳවා ගැනීමේ පටිපාටිය හරහා වඩාත් සුදුසු පුද්ගලයින් බඳවා ගැනීම.	85	52	80%	2022 අග භාගයේ සැලසුම් කළ බඳවා ගැනීම් අවසන් කිරීම 2023 දක්වා ඉදිරියට ගෙනයාමට සිදු විය.
වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම/ උසස්වීම් ක්‍රියා පටිපාටිය පවත්වාගෙන යාම	වැ.වර්ධක - 842 උසස්වීම් - 37	වැ.වර්ධක829 උසස්වීම් - 37	98% 100%	
විශ්‍රාමික ලිපිගොණු සැකසීම	32	32	100%	
පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක කාරක සභා පැවැත්වීම	03	03	100%	
මෙත්සෙවන නවාතැන් ලබාදීම	300 (ඉල්ලීම්)	243	81%	
බස් බලපත්‍ර/දුම්රිය වාර/දුම්රිය වරෙන්තු නිකුත් කිරීම	657	657	100%	

රක්ෂණ පහසුකම් ලබාදීම	150	146	97.33%	
කාර්ය මණ්ඩලීය නිල නිවාස ලබා දීම හා නඩත්තුව	15 (නිවාස)	15 (නිවාස)	100%	

මන්ත්‍රී සේවා කාර්යාංශය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පහසුකම් සපයා දීම මෙම අංශයේ මූලික වගකීම වන අතර ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනෙකුත් දෙපාර්තමේන්තු/අංශ හා බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් එම කටයුතු මෙම අංශය මඟින් සිදු කරයි. 2022 වර්ෂයේ මන්ත්‍රී සේවා කාර්යාංශය විසින් සිදු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය පහත දැක්වෙන පරිදි වේ.

අරමුණ	යෝජිත ක්‍රියාකාරකම්	ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස)	අපේක්ෂිත ප්‍රගතිය ලඟා කර ගැනීමට නොහැකිවූ හේතුව
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අත්‍යාවශ්‍ය පහසුකම් ලබා දීම	1. ගෘහ්‍ය කාරක සභා රැස්වීම පැවැත්වීම	100%	
	2. මාදිවෙල නිවාස සංකීර්ණයේ නිවාස වෙන් කිරීමට අදාල කටයුතු	100%	
	3. නුවර එළිය සෙන්පති නිවසේ කාමර වෙන් කිරීම සම්බන්ධීකරණය කිරීම	100%	
	4. සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමඟ මාදිවෙල නිවාස සංකීර්ණයේ සහ නුවර එළිය සෙන්පති නිවසේ , අලුත්වැඩියා/නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම	100%	
	5. මාදිවෙල නිවාස ඒකක වල, නුවර එළිය සෙන්පති නිවස සහ ගරු කථානායක නිල නිවස -විදුලිය, ජලය, රෙදිපිලි පිරිසිදු කිරීම සහ දුරකථන බිල්පත් පියවීම,	100%	
	6. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාල කටයුතු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.	100%	
	7. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාර්යාල උපකරණ සැපයීමට අදාල කටයුතු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කිරීම.	100%	
	8. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා භාෂා පුහුණු වැඩ සටහන් පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම	100%	
	9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මාසිකව ලිපි ද්‍රව්‍ය ලබාදීම	100%	

මානව සම්පත් සංවර්ධන අංශය

2019 ජූලි මස 19 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා 2020 ජනවාරි මස 07 වැනි දින මානව සම්පත් සංවර්ධන කාර්යාංශය ස්ථාපිත කරන ලදී.

ආයතනික අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සැකසුනු 2022 වසරට අදාල ක්‍රියාකාරී සැලැස්මේ (Annual Action Plan) මානව සම්පත් සංවර්ධන කාර්යාංශය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල අත්පත් කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ ප්‍රතිශතාත්මක වාර්තාව පහතින් දැක්වන අයුරින් කාරුණිකව ඉදිරිපත් කරමි.

	අරමුණු	ප්‍රගතිය ප්‍රතිශතාත්මකව
01	**සම්පත් දායකයින් සහ පුහුණුකරුවන් හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම**	**50%**
02	**පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම**	**87.5%**
03	**පාර්ලිමේන්තුවේ ක්‍රියා පටිපාටි, සංස්කෘතිය, ව්‍යුහය සහ පරිසරය පිළිබඳව හුරුපුරුදු වීම**	**75%**
04	**පුහුණු වැඩසටහන් හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම**	**40%**
05	**විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම**	**95%**
06	**අත්දැකීම් පාදක ඉගැන්වීම තුළින් සේවකයින්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම**	**85%**

ප්‍රවාහන කාර්යාංශය

ප්‍රවාහන අංශය විසින් 2022 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන් හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ සංචිතයට අයත් සියලුම වාහන වල නඩත්තු කටයුතු අලුත්වැඩියා කටයුතු (2022 වර්ෂය අවසානයේ වාහන සංචිතයේ වාහන ගණන 90 කි)

   i. ගරු කථානායකතුමා, ගරු නියෝජ්‍ය කථානායකතුමා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා සහ එතුමන්ලාගේ නිල වාහන හිමි කාර්ය මණ්ඩලයන් වෙත වාහන අනුයුක්ත කිරීම.

ii. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ඇතුළු අනෙකුත් නිල වාහන හිමි නිලධාරීන් හට වාහන අනුයුක්ත කිරීම.

iii. පාර්ලිමේන්තු සංචිතයට අයත් වාහන වලට මෙන්ම ගරු කථානායකතුමා / ගරු නියෝජ්‍ය කථානායකතුමා / ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා සහ නිලධාරීන්ට වෙන් කළ වාහන සඳහා ඉන්ධන ලබා දීම.

ආ) I. පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ වාහන සංචිතයට අයත් සියලුම වාහන වලට සමූහ රක්ෂණාවරණය ලබා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවා රක්ෂණ ආයතනයක් තෝරා ගැනීම.

Ii. බස් රථ, ලොරි රථ සහ ගිලන් රථය සඳහා මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂක මහතෙකු පාර්ලිමේන්තුවට ගෙන්වා වාහන පරීක්ෂා කර එම වාහන සඳහා යෝග්‍යතා සහතික ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

ඇ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ වාහන සංචිතයට අයත් සියලුම වාහන වල අළුත් වැඩියාවන් සහ සේවා කටයුතු සඳහා අදාළ නියෝජිත ආයතන වෙත හෝ ලියාපදිංචි ගරාජ වෙත යොමු කිරීම. සුළු අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු පාර්ලිමේන්තුවේ වාහන වැඩපොළ මඟින් සිදු කිරීම.

ඈ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා සම්බන්ධව පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට අයත් වාහන සංචිතය නව්‍යකරණය සඳහා කටයුතු සංවිධානය කිරීම හා නව වාහන පාර්ලිමේන්තු සංචිතයට ලබා ගැනීමට කටයුතු කිරීම.

ඉ) පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ වාහන සංචිතයට ලබාදෙන වාහන වල අයිතිය පවරා ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම.

ඊ) පාර්ලිමේන්තු වාහන සඳහා ඉන්ධන සැපයීම, ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම හා අදාල ඉන්ධන බිල්පත් පියවීම.

<u>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ ඒකකය</u>

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව පිහිටුවනු ලැබූ තොරතුරු දැන ගැනීමේ ඒකකයේ 2022 වර්ෂයට අදාල කාර්ය සාධනය පහත සඳහන් පරිදි වේ.

වර්ෂය තුල ලද ඉල්ලීම් සංඛ්‍යාව	159
සම්පූර්ණයෙන්ම තොරතුරු සැපයූ ඉල්ලීම් සංඛ්‍යාව	100
අර්ධ වශයෙන් තොරතුරු සැපයූ ඉල්ලීම් සංඛ්‍යාව	19
තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	40
නම් කළ නිලධාරී වෙත කරන ලද අභියාචනා සංඛ්‍යාව	23

තොරතුරු කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනා සංඛ්‍යාව	02
නම් කළ නිලධාරි අභියාචනා කිරීම මත තොරතුරු සැපයූ ඉල්ලීම් සංඛ්‍යාව	06
තොරතුරු කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනා මත තොරතුරු සැපයූ ඉල්ලීම් සංඛ්‍යාව	-
තොරතුරු සැපයීම සඳහා ගන්නා ලද සාමාන්‍ය කාලය (දින)	10

හැන්සාඩ් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු රැස්වීම්, පාර්ලිමේන්තු කාරක සභා, සම්මන්ත්‍රණ, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගම් සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් සම්මන්ත්‍රණ අපක්ෂපාතීව, නිවැරදිව හා කලට වේලාවට වාර්තා කිරීම, සුවිගත කිරීම සහ ශ්‍රව්‍ය වාර්තාකරණයන් අධීක්ෂණය සහතික කරයි.

2022 වර්ෂය තුළ හැන්සාඩ් දෙපාර්තමේන්තුව ඉටු කළ කාර්යය පහත සඳහන් වේ:

01. පාර්ලිමේන්තු රැස්වීම් දින 101 ක් ආවරණය කිරීම සහ ඊට අදාළ හැන්සාඩ් වාර්තා 101 මුද්‍රණය කිරීම.

02. අදාළ හැන්සාඩ් වාර්තා 101 පාර්ලිමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම.

03. වර්ෂය පුරා පවත්වන ලද විවිධ කාරක සභා වාර 140ක කටයුතු ආවරණය කිරීම.

04. අදාළ කාරක සභා වාර්තා 89 ක් පදානුගතව වාර්තා කර, සංස්කරණය කිරීමෙන් අනතුරුව අදාළ කමිටු කාර්යාංශ වෙත යැවීම.
05. කාණ්ඩ 285 සිට 292 දක්වා හැන්සාඩ් වාර්තා 74ක සෝදුපත් කියවීම.
06. කාණ්ඩ 285 සිට 290 දක්වා ශෝධිත හැන්සාඩ් වාර්තා 63ක අවසාන මුද්‍රණ කටයුතු සඳහා යොමු කිරීම.

සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ජාතික වටිනාකමකින් යුත් සුවිශේෂී පොදු දේපළක් ලෙස පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සුරක්ෂිත කිරීම හා එය ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් නඩත්තු කිරීම හා එහි ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන්හි කාර්ය සාධනය පහත පරිදි වේ.

අරමුණ	යෝජිත ක්‍රියාකාරකම	2022 වසර අවසානයේ කාර්යය සාධනය	අපේක්ෂිත ඉලක්ක වලට ළඟා වීමට නොහැකි වීමට හේතු
පාර්ලිමේන්තු සංකීර්ණයේ නවීකරණය කිරීමේ කටයුතු /අළුත්වැඩියා කටයුතු / නඩත්තු කටයුතු	MCCBs සහ බල සාධක නිවැරදි කිරීමේ ධාරිත්‍රක බැංකු ප්‍රතිස්ථාපනය කිරීම	100%	-
	ඇමති කාමර වායු සමනය කිරීම	0%	දැනටමත් අයිතමවලින් කොටසක් බාර දී ඇත. තවම වැඩ ආරම්භ කොට නැත. කාර්ය සාධන බැඳුම්කර දැනටමත් කල් ඉකුත් වී ඇත.
	උත්පාදක පද්ධතියක් සැපයීම, බෙදා හැරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම	0%	ප්‍රතිපාදන ලැබී නැත
	බාහිර ග්ලෝබ් ලාම්පු කණු ආදේශ කිරීම	0%	ප්‍රතිපාදන ලැබී නැත
	මධ්‍යම වායු සමීකරණ පද්ධතියේ ද්විතියික ශීත කළ ජල පොම්ප ප්‍රතිස්ථාපනය කිරීම	0%	ප්‍රතිපාදන ලැබී නැත
	පාර්ලිමේන්තුවේ ද්විතියික ජල පොම්පාගාරයේ පොම්ප ආදේශ කිරීම	0%	ප්‍රතිපාදන ලැබී නැත
	පින්නියර ආරක්ෂක ගොඩනැගිල්ලේ නව ඉදිකිරීම්	60%	අයහපත් කාලගුණය දිග
	ජයන්තිපුර ආරක්ෂක ගොඩනැගිල්ලේ නව ඉදිකිරීම්	0%	ප්‍රතිපාදන ලැබී නැත
	ප්‍රධාන ගොඩනැගිල්ලේ සාමාන්‍ය නඩත්තුව	20%	ප්‍රතිපාදන සීමා වීම
	සෝපාන, ජල පොම්ප, කපාට, AHU උපාංග අලුත්වැඩියා කිරීම	20%	ප්‍රතිපාදන සීමා වීම
	ගොඩනැගිල්ල පින්තාරු කිරීම (අභ්‍යන්තර සහ පිටත), සිවිලිම සහ අනෙකුත් ස්ථාන	30%	ප්‍රතිපාදන සීමා වීම
	නඩත්තු කටයුතු ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය,VRV පද්ධතීන් ,වායු සමීකරණ යන්ත්‍ර ශීත කාරක පද්ධති	50%	ප්‍රතිපාදන සීමා වීම
	සභාගර්භයේ ශබ්ද පාලන පද්ධතිය සහ විද්‍යුත් ඡන්ද ක්‍රමය නඩත්තු කිරීම	75%	ප්‍රතිපාදන සීමා වීම
	සභාගර්භයේ විකාශන කැමරා පද්ධතිය පවත්වාගෙන යාම	50%	ප්‍රතිපාදන සීමා වීම

	උත්පාදක යන්ත්‍රය නඩත්තු කිරීම සහ ගිවිසුම්	50%	ප්‍රතිපාදන සීමා වීම
	මුළුතැන්ගෙය වටා වැල්ඩින් කරන ලද මල නොබැඳෙන වානේ දැලක් සවි කිරීම	0%	ප්‍රතිපාදන ලැබී නැත
ගරු කථානායකතුමාගේ නිල නිවස	ගොඩනැගිල්ල නඩත්තු කිරීම, ලාම්පු සවිකිරීම් ප්‍රතිස්ථාපනය කිරීම සහ දුරකථන පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම	10%	ප්‍රතිපාදන සීමා වීම
	උපකරණ නඩත්තු	20%	ප්‍රතිපාදන සීමා වීම
	ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිල්ලට එකතු කිරීම	10%	ප්‍රතිපාදන සීමා වීම
මාදිවෙල,නුවර එළිය සෙන්පති මැදුර,ජයවඩනගම නිවාස සංකීර්ණය හා මෙත් සෙවණ නිවාඩු නිකේතනය	උපකරණ නඩත්තු කිරීම,ගොඩනැගිලි අලුත්වැඩියාව, නව ඉදිකිරීම්	30%	ප්‍රතිපාදන සීමා වීම
	මාදිවෙල MPP නිල නිවාසයේ වැසි ජල අපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම - II අදියර	0%	ප්‍රතිපාදන ලැබී නැත

<u>මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව</u>

අධ්‍යක්ෂ (මුදල්) යටතේ අධීක්ෂණය වන කාර්යාංශ තුනකින් මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව සමන්විත වේ.

1. මුදල් හා ගිණුම් කාර්යාංශය
2. සැපයුම් හා සේවා කාර්යාංශය
3. ආහාරපාන ගිණුම් කාර්යාංශය

රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ලෙස පාර්ලිමේන්තු මහ ලේකම් වරයා වෙත ලැබී ඇති බලතල වලින් බොහෝ ප්‍රමාණයක් මුල්‍ය කලමනාකරණ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ (මුදල්) වෙත පවරා ඇති අතර දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබන ප්‍රධාන කටයුතු කිහිපයක් පහතින් දක්වා ඇත.

i. අයවැය සකස් කිරීම සහ වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් එකතු කිරීම හා අයවැය පාලනය, ගිණුම්කරණය, අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම.
ii. පාර්ලිමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු පරිපාලනය කිරීම.
iii. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, විශ්‍රාමික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, කාර්ය මණ්ඩලයට සහ විශ්‍රාමික කාර්ය මණ්ඩල සාමජිකයින්ට, අනියම් සහ සහන සේවකයින්ට වැටුප් සහ දීමනා ගෙවීම.
iv. සැපයුම්කරුවන්ට සහ සේවා සපයන ආයතන වලට අදාල ගෙවීම් සිදුකිරීම.

2022 වර්ෂයට අදාලව මුදල් හා ගිණුම් කාර්යාංශයට අදාලව කාර්ය සාධනය පහත දැක්වේ

විෂය පථය	යෝජිත කාර්යය	2022වර්ෂයේ අවසානය වන විට ප්‍රගතිය (%)	අපේක්ෂිත ඉලක්ක කරා ලඟා නොවීමට හේතු
ගෙවීම්	i. කාර්ය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ගෙවීම	100	
	ii. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම	100	
	iii. වෙනත් පුනරාවර්තන වියදම්	97	ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ලෙස අග්‍රිම නොලැබීම
	iv. ප්‍රාග්ධන වියදම්	35	ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ලෙස අග්‍රිම නොලැබීම
අයවැය	i. අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම	100	
	ii. අයවැය පාලනය	94	ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ලෙස අග්‍රිම නොලැබීම සහ ඇතැම් සැපයුම් හා සේවා ලබාගැනීම දුෂ්කරවීම
ණය	i. ණය පහසුකම් ලබාගැනීම	100	
	ii. ණය අයකර ගැනීම	100	
	iii. අත්තිකාරම් බී ගිණුම සැකසීම සහ ණය ශේෂයන් යාවත්කාලීන කිරීම	100	
වාර්තා	• මූල්‍ය ප්‍රාකාශන සැකසීම	100	
	• බැංකු සැසඳුම් වාර්තාව සැකසීම	100	
	• අග්‍රිම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීම	100	
	• ආදායම් ගිණුම සැකසීම	100	
	• වාර්ෂික මුදල් ප්‍රවාහ ගිණුම සැකසීම	100	
ආදායම් එකතු කිරීම	බිල්පත් ක්‍රියාවලිය අධීක්ෂණය	100	

සැපයුම් හා සේවා කාර්යාංශය

පාර්ලිමේන්තු කටයුතු පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාපිත දෙපාර්තමේන්තු 09 සහ එම දෙපාර්තමේන්තු යටතේ ගැනෙන කාර්යාල සහ කාර්යාංශ මඟින් සලසනු ලබන සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයාදීම මූලිකවම සැපයුම් හා සේවා කාර්යාංශය වෙත පැවරී ඇති වගකීම වේ.

2022 වර්ෂය සිදුකරන ලද ප්‍රාග්ධන (Capital) ප්‍රසම්පාදනයන්

පහතින් දක්වා ඇති ප්‍රාග්ධන ප්‍රසම්පාදනයන් ජාතික තරඟකාරී ලංසු සහ වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා සිදු කරන ලදි.

අනු අංකය	ප්‍රසම්පාදනය පිළිබඳ විස්තරය	නිම කරන ලද දිනය හෝ නිම කිරීමට නියමිත දිනය	වැය කරන ලද / වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල (බදු සහිතව) රු.	විශේෂ සටහන්
1	පවතින MCCB ප්‍රතිස්ථාපන ප්‍රසම්පාදනය සහ පාර්ලිමේන්තුවේ උපපොළේ ස්වයංක්‍රීය බල සාධක නිවැරදි කිරීමේ පැනලය (ධාරිත්‍රක බැංකුව) සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ආරම්භ කිරීම	10.11.2022	9,017,761.80	21.12.2022 දින නිම කරන ලදී
2	01.10.2021 දින අකුණු ගැසීම නිසා හානියට පත් උපාංග ආදේශ කිරීම	26.05.2022	3,953,638.31	රු. 3,558,173.67 මුදලක් රක්ෂණ ආයතනය විසින් ලැබිණි.
3	2021.08.11 දින නුගසෙවන සහ ගේට්ටුව අංක 01 හි හානියට පත් භාණ්ඩ ප්‍රතිස්ථාපනය කිරීම	10.11.2022	1,058,945.40	රු. 953,050.86 මුදලක් රක්ෂණ ආයතනය විසින් ලැබිණි.
4	පාර්ලිමේන්තුවේ පොදු වැසිකිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම		6,020,005.77	දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2023 වර්ෂයේ සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

5	කාර්යාලීය උපකරන ප්‍රසම්පාදනය 2021 (ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ප්‍රොජෙක්ටර් සහ ස්කැනර්		763,800.00	සැපයුම්කරුවකු සොයා ගැනීමට නොහැකි විම නිසා ඉදිරි ඉල්ලීම් මත මුද්‍රණ යන්ත්‍ර සහ ප්‍රොජෙක්ටර් මිලදී ගැනීමට තීරණය කරන ලදී. එබැවින් මෙම ප්‍රසම්පාදනයේදී ගෙවා ඇත්තේ 357800.00 ක් පමණි.
6	පරිගණක උපාංග මිලදී ගැනිම	12.09.2022	573,000.00	නිම කරන ලදී
7	10KVA UPS & LED Monitors මිලදී ගැනීම	30.09.2022	1,871,150.00	නිම කරන ලදී
8	KVM ස්විචය ප්‍රසම්පාදනය කිරීම	27.01.2023	992,301.22	23.09.2023 දින නිම කිරීමට නියමිතය
9	උද්‍යාන අංශය සඳහා වංවල ආරක්ෂිත බාධක මිලදී ගැනීම		600,000.00	නිම කරන ලදී
	සමස්ත පිරිවැය රු.		**24,850,602.50**	

එමෙන්ම 2022 වර්ෂය තුළ සිදුකරන ලද අයභාර (Recurrent) ප්‍රසම්පාදන සඳහා දරා ඇති සමස්ථ පිරිවැය රුපියල් **216,863,466.93** වන අතර 2022 වර්ෂයේ සිදු කරන ලද අලුත්වැඩියාවන්, නඩත්තු හා සේවා කටයුතු සඳහා රුපියල් **16,761,072.80**ක සමස්ථ පිරිවැයක් දරා ඇත. එමෙන්ම , විවෘත වෙළඳපොල මිල ගණන් කැඳවා 2022 වර්ෂය තුල තවදුරටත් සැපයුම් හා සේවා කාර්යාංශය විසින් ඉටුකරන ලද කාර්යයන් සඳහා රු. **74,472,627.60**ක සමස්ථ පිරිවැයක් දරා ඇත.

<u>**ආහාරපාන සහ ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුව**</u>

ආවරණික ක්ෂේත්‍ර	**අරමුණු**	**2022 වසර අවසානයේදී සපුරන ලද ඉලක්කය (%)**	**අපේක්ෂිත ඉලක්කය ලඟා කර නොගැනීමට හේතු කෙටියෙන්**
ආහාරපාන	මන්ත්‍රිවරුන් සඳහා ආහාර සැපයීම	77%	
ආහාරපාන	මන්ත්‍රිවරුන්ගේ අමුත්තන් සහ කාර්ය මණ්ඩලය සඳහා ආහාර සැපයීම	97%	
පුහුණු සැසි	සේවාස්ථ පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම	60%	
අලංකරණ පැල සහ මල් සැරසිලි		100%	අරමුදල් ඌනතාවය

	විසිතුරු මල්/ ගෘහස්ථ සැරසිලි සඳහා පැල / පැල සහ සහ පෝච්චි සැපයීම	100% 100%	හේතුවෙන් නැවුම් මල් වෙනුවට කෘත්‍රිම මල්වලින් මල් සැරසිලි ආවරණය කිරීම
උද්‍යාන අලංකරනය	උද්‍යානය සහ පැල තවාන් නඩත්තුව	100%	
රෙදිපිළි සේදීම	නිළ ඇඳුම් සහ රෙදිපිළි සේදීම	48%	අධික සේවා ගාස්තු හේතුවෙන් සේදුම් වාරගණන අඩු කිරිම
පිරිසිදු කිරීම	කාර්යාල කාමර, කමිටු කාමර, ලොබි පිරිසිඳු කිරීම/ වැසිකිලි පිරිසිඳු කිරීම හා නඩත්තුව/ මුළුතැන්ගෙය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය පිරිසිදු කිරීම /ගොඩනැගිල්ල විෂබීජහරණය කිරීම සහ දැත් විෂබීජහරණය සඳහා පහසුකම් සැපයීම	100%	

<u>තොරතුරු පද්ධති සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව</u>

තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම, අන්තර්ජාල සම්බන්ධතාවන් වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තු අන්තඃජාලය කාර්යක්ෂම හා ඵලදායි ලෙස පවත්වාගෙන යාම සහ කළමනාකරණය, පාර්ලිමේන්තුවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපකරණ නඩත්තුව මගින් පාර්ලිමේන්තුවේ සියලු තොරතුරු තාක්ෂණ පාදක පරිපාලන ක්‍රියාකාරකම් ඉටු කිරීම.

2022 වර්ෂයේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පහතින් දක්වා ඇත.

අරමුණ	**යෝජිත ක්‍රියාකාරකම්**	**වසර අවසන කාර්ය සාධනය**	**අපේක්ෂිත ඉලක්ක වලට ලඟා වීමට නොහැකි වූ හේතු කෙටියෙන්**
ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම	I. කාර්ය මණ්ඩලයට හැකියාවර්ධන සහ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම	60%	
	II. කාර්ය මණ්ඩයේ තිදෙනෙකු e-පාර්ලිමේන්තු සමුළුවට සහභාගි කරවීම	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	
	III. ICT උපකරණ නඩත්තුව සහ වැඩි දියුණු කිරිම	90%	

	IV.	පරිගණක 25 ක් , මුද්‍රණ යන්ත්‍ර 15 ක් සහ UPS 30 ක් මිලදී ගැනීම	UPS 30-මිලදී ගෙන ඇත.	පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන නොමැත (අරමුදල් හිඟකම)
	V.	ICT යටිතල පහසුකම් නිරන්තර අධීක්ෂණය සහ නඩත්තුව	90%	
	VI.	Intranet Portal නඩත්තුව	90%	
	VII.	I parliament Database වැඩි දියුණු කිරිම	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	මානව සම්පත හිඟකම
	VIII.	ප්‍රලේඛන පද්ධතිය සමඟ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) ඒකාබද්ධ කිරිම හා වැඩි දියුණු කිරිම	70%	DMS ව්‍යාප්තියේ කටයුතු අවශ්‍ය පරිසාද මට්ටමට නොමැති විම නිසා නැවත සකස් කිරීමට යොමුකර ඇත.
	IX.	ප්‍රවේශ පාලන පද්ධති වැඩ සටහන ක්‍රියාත්මක කිරිම	75%	වේත්‍රධාරි දෙපාර්තමේන්තුව මඟින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.
	X.	බඳවගැනීම් සහ මානව සම්පත වැඩ සටහන වැඩි දියුණු කිරිම (MIS)	70%	ආයතන අංශය මඟින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.
	XI.	ස්වයංක්‍රිය නිවාඩු කළමනාකරණ පද්ධතිය ක්‍රියත්මක කිරිම	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	DMS ව්‍යාප්තියේ කටයුතු නිම නොවිම.
	XII.	I parliament ජංගම දුරකථන යෙදුම නඩත්තුව (ඇපල් දුරකථන)	70%	මානව සම්පත හිඟකම
	XIII.	පාර්ලිමේන්තු ජංගම යෙදුම නිරන්තරයෙන් යාවත් කාලීන කිරීම සහ වැඩි දියුණු කිරීම	80%	
	XIV.	පාර්ලිමේන්තු ජාල පද්ධතිය වැඩි දියුණු කිරිම (USAID ආධාර යටතේ)	100%	
	XV.	පෙරිමීටර් පයර්වෝල් වාර්තාකරණ සහ කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරිම	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	ප්‍රතිපාදන නොමැතිවීම
	XVI.	Email Archive	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	ප්‍රතිපාදන නොමැතිවීම

	XVII.	DR Site පද්ධතිය වැඩි දියුණු කිරිම	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	ප්‍රතිපාදන නොමැතිවීම
	XVIII.	අතිරේක ගබඩා පද්ධතිය (backup & Restoring)	ක්‍රියාත්මක කිරිමට නොහැකි විය	ප්‍රතිපාදන නොමැති වීම
	XIX.	Android කාර්ය මණ්ඩල ජංගම දුරකථන යෙදුම යාවත් කාලීන කිරිම	100%	
	XX.	ලේඛණාගාරය සඳහා තොරතුරු පද්ධති වැඩසටහන	80%	
	XXI.	පුස්තකාල පර්යේෂණ සඳහා පරිගණක වැඩසටහන	80%	
	XXII.	CCTV පද්ධතිය නිරන්තර අධීක්ෂණය හා නඩත්තුව	100%	
	XXIII.	අවශ්‍යතාව මත ජාල පද්ධතිය පුළුල් කිරීම	100%	
ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණය මගින් ශක්තිමත් කිරීම	i.	හැන්සාඩ් වාර්තාව ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) මගින් සකස් කිරිම	70%	**DMS ව්‍යාප්තිය හා බැදී පවති**
	ii.	DMS ව්‍යාප්තිය වෙනුවෙන් දැනුවත් කිරිමේ සහ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම		**එම ව්‍යාප්තියේ වැඩ කටයුතු**
	iii.	දිනට නියමිත වැඩ පිළිවෙල / න්‍යාය පත්‍රය /ලිපි පිළිගැන්වීම /පාර්ලිමේන්තු කටයුතු කාරක සභාව/ DMS ව්‍යාප්තිය යටතේ ක්‍රියාත්මක කිරිම		**නිම වන තුරු මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කළ නොහැක.**
	iv.	දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම (DMS) දිනට නියමිත වැඩ පිළිවෙල (Order of business)		
රජයේ අධීක්ෂණය තොරතුරු තාක්ෂණය හරහා බල ගැන්වීම	i.	උපදේශක කාරක සභා තොරතුරු පද්ධති කළමනාකරණය තුලින් යාවත් කාලීන කිරිම	70%	
	ii.	උපදේශක කාරක සභා කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම		දැනුවත් කිරීමේ වැඩසටහන් කර ඇත
	iii.	NCC ජාතික සභා කමිටුව සඳහා තොරතුරු පද්ධති වැඩසටහන	80%	
	iv.	PAC රාජ්‍ය ගිණුම් කාරක සභා තොරතුරු පද්ධති වැඩ සටහන යාවත්කාලීන කිරීම	80%	

නායකත්වය සහ නියෝජනය පිළිබඳව මන්ත්‍රිවරුන් ගේ කාර්යභාර්ය පිළිබඳ දැනුවත් කිරීම	i.	පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සඳහා Intranet portal ජංගම යෙදවුම යාවත්කාලීන කිරීම	100%	
	ii.	Intranet portal ජංගම යෙදවුම පිළිබඳව මන්ත්‍රිවරුන් දැනුවත් කිරිම	100%	
මහජනතාව වෙත සේවාවන් ව්‍යාප්ත කිරීම	i.	ලේඛන ක්‍රියාවලිය ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) ,ජාල පද්ධතිය හා ජංගම දුරකථන පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීම		DMS ව්‍යාප්තිය හා බැඳී පවතී.
	ii.	ජංගම යෙදවුම් පද්ධතිය යාවත්කාලින කිරිම		DMS ව්‍යාප්තිය හා බැඳී පවතී.
	iii.	Event Management තොරතුරු පද්ධති වැඩසටහන	80%	

පහත තොරතුරු පද්ධති වැඩසටහන් 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අඩංගු නොවූ අතර හදිසි ආයතන අවශ්‍යතා අනුව සම්පාදනය කර ඇත.

I. **ආයතන ධාරිතාව ශක්තිමත් කිරීම**
   a. ලේඛණාගාරය සඳහා තොරතුරු පද්ධති වැඩසටහන
   b. XXI. පුස්තකාල පර්යේෂණ සඳහා තොරතුරු පද්ධති වැඩසටහන

II. **රජයේ අධීක්ෂණය තොරතුරු තාක්ෂණය හරහා බල ගැන්වීම**
   a. III. NCC ජාතික සභා කමිටුව සඳහා තොරතුරු පද්ධති වැඩසටහන
   b. IV. PAC රාජ්‍ය ගිණුම් කාරක සභා තොරතුරු පද්ධති වැඩ සටහන යාවත්කාලින කිරිම

III. **මහජනතාව වෙත සේවාවන් ව්‍යාප්ත කිරීම**
   a. Iii. Event Management තොරතුරු පද්ධති වැඩසටහන

<u>සන්නිවේදන දෙපාර්තමේන්තුව</u>

2019 වර්ෂයේ අගෝස්තු මස ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නවතම දෙපාර්තමේන්තුව වන සන්නිවේදන දෙපාර්තමේන්තුව මේ වන විට වසර දෙකහමාරක් පුරා ක්‍රියාත්මක වෙමින් පවති. එහි ප්‍රධාන අංශ දෙකකි. එම අංශ දෙක විසින් 2022 වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1. මාධ්‍ය අංශය

<table>
<tr><th>අරමුණ</th><th>යෝජිත ක්‍රියාකාරකම්</th><th>ප්‍රතිශතය</th><th>වගකීම
ඉටු නොකිරීමට හේතුව</th></tr>
<tr><td rowspan="4">1.පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හරහා වැඩි දැනුවත් කිරීම් සහ මහජන සහභාගීත්වයක් ඇති කිරීම</td><td>1.පාර්ලිමේන්තුව ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය ආයතනවලින් මාධ්‍ය ප්‍රචාරය ලබා ගැනීම</td><td>95%</td><td>1.සමහර මාධ්‍ය නිවේදන නිසි අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් මාධ්‍ය වෙත නිකුත් කිරීමට ප්‍රමාද විය.

2. පාර්ලිමේන්තුව වාර අවසාන කිරීම හේතුවෙන්ද මාධ්‍ය නිවේදනවල යම් අඩුවක් දක්නට ලැබේ.

3. රටේ පැවති අරගල තත්වය සහ පාර්ලිමේන්තුව රැස්වීම අඩු වීම නිසා මාධ්‍ය නිවේදන ප්‍රමාණයේ අඩුවක් තිබේ.</td></tr>
<tr><td>2. පාර්ලිමේන්තු පරිශ්‍රයේ විවිධ වැඩසටහන් පටිගත කිරීමට මාධ්‍ය ආයතනවලට ආරාධනා කිරීම</td><td>0%</td><td>පැවති තත්ත්වයන් හේතුවෙන් කිසිදු වැඩසටහනක් පටිගත කිරීම සිදු නොවීණි.</td></tr>
<tr><td>3. පාර්ලිමේන්තුවේ සංචාරක වැඩසටහන් නිර්මාණය කිරීමට සංචාරක වැඩසටහන් වලට ආරාධනා කිරීම.</td><td>0%</td><td>පැවති තත්ත්වයන් හොතුවෙන් එවැනි වැඩසටහන් නිර්මාණය කිරීම සිදු නොවිණි.</td></tr>
<tr><td>4. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වැදගත් මාතෘකා යටතේ විවිධ ආකාරයේ වැඩසටහන් කිරීමට මාධ්‍ය ආයතන පෙළඹවීම</td><td>50%</td><td>මේ සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන කිහිපයක් සම්බන්ධීකරණය කිරීමට මාධ්‍ය අංශයට හැකි විය.</td></tr>
<tr><td rowspan="2">2. පාර්ලිමේන්තු කටයුතු පිලිබඳ වැඩි මහජන සහභාගීත්වය ඇති කිරීම සඳහා සමාජ මාධ්‍ය හරහා දැනුවත් කිරීම</td><td>1. නවතම ප්‍රවේශයන් සමඟින් දිනපතා නිල Facebook පිටුව යාවත්කාලීන කිරීම සහ පවත්වා ගන්න.</td><td>95%</td><td>පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ සමාජ මාධ්‍ය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම සිදුවිය.</td></tr>
<tr><td>2. නිල Twitter ගිනුම නඩත්තු කිරීම සහ නවතම ප්‍රවේශයන් සමඟ දිනපතා යාවත්කාලීන කිරීම.</td><td>95%</td><td>Twitter හි දෛනික යාවත්කාලීන කිරීම් සිදු විය. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ සමාජ මාධ්‍ය වේදිකා නඩත්තු කිරීම නොකඩවා සිදු කෙරිණි.</td></tr>
</table>

	3. Instagram ගිණුම නඩත්තු කර නවතම ප්‍රවේශයන් සමඟ දිනපතා යාවත්කාලීන කිරීම.	95%	Instagram හි දෛනික යාවත්කාලීන කිරීම් සිදු විය. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ සමාජ මාධ්‍ය වේදිකා නඩත්තු කිරීම නොකඩවා සිදු කෙරිණි.
	4. නිල You tube නාලිකාව නඩත්තු කර නවතම ප්‍රවේශයන් සමඟ දිනපතා යාවත්කාලීන කිරීම	95%	You tube නාලිකාවෙහි සතිපතා යාවත්කාලීන කිරිම සිදු කෙරිණි.
3. මාධ්‍යවේදීන්ට සහ මන්ත්‍රීවරුන්ට පහසුකම් සැලසීම සඳහා මාධ්‍ය මධ්‍යස්ථානයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.	1.මාධ්‍ය මධ්‍යස්ථානය සඳහා නිසි සම්මත ලේඛන පද්ධතියක් පවත්වාගෙන යාම.	95%	සම්මත පද්ධතිකරණය සහ භාවිතය සඳහා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිසි පරිචයන් පවත්වා ගෙන යාමට හැකි විය.
	2 නිසි ඉන්වෙන්ටරි පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම.	95%	
	3. පාර්ලිමේන්තුව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය පට නිෂ්පාදනය කිරීම	60%	එක් මාධ්‍ය කිලධාරී පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ශ්‍රව්‍ය දෘෂ්‍ය නිශ්පාදනය කිරීම අඩු මට්ටමක පැවතිණි.
4.මාධ්‍යවේදීන්ට සහ මන්ත්‍රීවරුන්ට පහසුකම් සැලසීම සඳහා පටිගත කිරීමේ මැදිරියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.	1. මාධ්‍යවේදීන්ට සහ මන්ත්‍රීවරුන්ට පහසුකම් සැලසීම සඳහා පටිගත කිරීමේ මැදිරියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.	70%	පටිගත කිරීමේ මැදිරිය භාවිතා කිරීම සඳහා පටිගත කිරීමේ මැදිරියෙහි නිසි කටයුතු පවත්වාගෙන යාමට හැකි විය. පැවති තත්ත්වය හේතුවෙන් සිදුකරන ලද නිශ්පාදන ප්‍රමාණය අඩු විය.
5. පාර්ලිමේන්තු වාර්තාකරණයේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම.	1. කමිටු වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු	20%	පාර්ලිමේන්තු වාර්තාකරණයේ විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා කාරක සභා වාර්තා ප්‍රමිතිකරණය කිරීම සඳහා පවත්වනු ලැබුවේ වැඩමුළු කිහිපයක් පමණි.
	2. සියලුම කමිටු, කාර්යයන් සහ දූත මණ්ඩල ආවරණය කර මාධ්‍ය වෙත නිකුත් කිරීමට අවශ්‍ය මාධ්‍ය සටහන් සකස් කිරීම.	85%	සියලුම කමිටු, කාර්යයන් සහ දූත කණ්ඩායම් ආවරණය කර මාධ්‍ය වෙත මාධ්‍ය සටහන් නිකුත් කළ අතර පැවති තත්ත්වය හේතුවෙන් සමහර රැස්වීම්

			අවස්ථාවන් මාර්ගගත ක්‍රමයට පැවැත්විනි.
6.පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් පිළිබඳ නිර්මාණාත්මක වීඩියෝ නිෂ්පාදනවල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම.	1. නිර්මාණාත්මක වීඩියෝ නිෂ්පාදන පිළිබඳ මාධ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.	0%	පැවති තත්ත්වය හේතුවෙන් කිසිදු පුහුණුවීම් වැඩසටහනක් පැවැත්වීමට නොහැකි විය.
7. මහජන සහභාගීත්වය ඉහළ නැංවීම/ මහජන සම්බන්ධතා වැඩසටහන් ඔස්සේ	1. පාර්ලිමේන්තුව පිළිබඳව වාර්තාමය චිත්‍රපටයක් නිර්මාණය කිරිම	50%	මෙහි පිටපත ලියා අවසන් කොට එම රූගත කිරීම් සඳහා අනුග්‍රාහකත්වයද සපයාගෙන මේ වන විට රූපගත කිරීම් ආරම්භ කොට තිබේ.
	2. පිටපත සංශෝධනය කිරීමට අවශ්‍ය නම් විශේෂඥයන් සම්බන්ධීකරණය කර අධ්‍යක්ෂණය කිරීමට පියවර ගැනීම.	100%	අවසන් කොට තිබේ.
	3. වාර්තා චිත්‍රපටයේ පූර්ව නිෂ්පාදන/ නිෂ්පාදනය/ පශ්චාත් නිෂ්පාදනය	100%	අවසන් කොට තිබේ.
	4. වාර්තා චිත්‍රපටය නිශ්පාදන කටයුතු අවසන් කිරීම.	30%	නිශ්පාදන අදියරේ පවති.
8. වෙනත් මූලාශ්‍ර ඔස්සේ පාර්ලිමේන්තුව සඳහා ප්‍රවර්ධන ව්‍යාපාරය ඇති කිරීම.	1. පාර්ලිමේන්තුව ප්‍රවර්ධනය කිරිම සඳහා ආකර්ෂණීය කෙටි වීඩියෝ ක්ලිප් නිශ්පාදනය කිරිම.	60%	පාර්ලිමේන්තුව ප්‍රවර්ධනය සඳහා ප්‍රශස්ත තත්ත්වයේ වාර්තාමය වීඩියෝ කිහිපයක් නිෂ්පාදනය කරන ලදී.
	2. LED වීඩියෝ බිත්තිවල ප්‍රදර්ශනය කිරීමට ප්‍රවර්ධන වීඩියෝ ක්ලිප් නිෂ්පාදනය කිරීම	0%	නැත. පැවති තත්ත්වයන් හේතුවෙන් ක්‍රියාත්මක නොවිණි.
	3. වඩා ක්‍රියාශීලි අන්තර් සන්නිවේදන උපක්‍රමයක් ලෙස පාර්ලිමේන්තු වෙබ් අඩවිය තුළ සජීවී කතාබස් උත්පතන මෙවලමක් නිර්මාණය කිරීම	0%	වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම නිසා නිර්මාණය කිරීම නතර විය. නමුත් සලකා බැලීම සඳහා අදාළ පාර්ශවයන් වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇත.
9.පුහුණු හා සංවර්ධන වැඩසටහන්	සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුව ලබා දීම	0%	පැවති තත්ත්වය හේතුවෙන් සිදු නොවීය.

2. <u>මහජන සේවා කාර්යාංශය</u>

අරමුණ	යෝජිත ක්‍රියාකාරකම්	ප්‍රතිශතය	වගකීම ඉටු නොකිරීමට හේතුව
1.ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව මහජන අවබෝධය ඉහළ නැංවීම/මහජන සහභාගීත්වය ඉහළ නැංවීම/ මහජන සම්බන්ධතා වැඩසටහන් හරහා	1.1. **<u>පාර්ලිමේන්තු විදූ පියස</u>** සූම් තාක්ෂණය මඟින් පාසැල් සහ වෙනත් ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් පැවැත්වීම. 1.2. මෙම වැඩසටහන් සඳහා වෙබ් අඩවිය මඟින් අයැදුම් කිරීමේ හැකියාව ලබාදීම. 1.3. **<u>පාර්ලිමේන්තුවෙන් පුස්තකාලයට</u>** වැඩසටහන් 146 ක් පැවැත්වීම.	90% 85% 90%	-
2. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව මහජන අවබෝධය ඉහළ නැංවීම	2.1 බාහිර දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් පැවැත්වීම. 2.2. මහජන සහභාගීත්වය දිරිගැන්වීම 2.3. සමාජයේ සුවිශේෂී ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම/ පාර්ශවකරුවන් සමඟ වැඩසටහන් 04ක් සංවිධානය කිරීම. *උදා:* • *ජාත්‍යන්තර කාන්තා දිනය* • *ජාත්‍යන්තර තරුණ දිනය*	90%	
3.පාර්ලිමේන්තු න්‍යාය, ක්‍රියා පටිපාටිය සහ එහි සමාජීය කාර්ය භාරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්	3.1. තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් සංවිධානය කිරීම. 3.2. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා පාර්ලිමේන්තුව පිළිබඳ සංක්ෂිප්ත පාඨමාලාවක් - 2022 වර්ෂයේ විශ්වවිද්‍යාල දෙකක් සඳහා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන්) ආරම්භ කිරීම. 3.3.පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් සංවිධානය කිරීම. 3.4. මාධ්‍යවේදීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීම.	90%	

	3.5. යොවුන් පාර්ලිමේන්තුව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පැවැත්වීම.		
4.මාර්ගගත ක්‍රමය ඔස්සේ මහජනතාවට පාර්ලිමේන්තුව පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීම	4.1. පාර්ලිමේන්තුවේ අතථ්‍ය චාරිකාව භාෂාත්‍රයෙන්ම නවීකරණය 4.2. පාර්ලිමේන්තුව පිළිබඳව දැනුවත් කිරීමට සහ අතථ්‍ය චාරිකාව ප්‍රචලිත කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්, සිවිල් සමාජ සහ ආයතන සමඟ සම්බන්ධ වීම. 4.3. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන්, දීපව්‍යාප්ත ශිෂ්‍ය පාර්ලිමේන්තු සමඟ පාර්ලිමේන්තුව පිළිබඳ දැනුම ,න්‍යාය සහ සංකල්ප බෙදාගැනීම (සූම් තාක්ෂණය මඟින් සහ බාහිර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම) පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව -12 සහභාගී වූ ගුරුවරුන් සංඛ්‍යාව -150 සහභාගී වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව - 6000 4.4 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ශිෂ්‍ය මැතිවරණය සඳහා මෘදුකාංගයක් හඳුන්වාදීම	60%	පිටපත ඉහළ කළමනාකාරීත්වයට ඉදිරිපත් කර ඇති අතර ඊට මූල්‍යමය දායකත්වය ලැබී ඇත.
5.පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම සඳහා	5.1. පාර්ලිමේන්තුවේ වාර්තා චිත්‍රපටය භාෂාත්‍රයෙන්ම නවීකරණය 5.2. වැඩසටහන ට අවශ්‍ය සම්බන්ධීකරණය	60%	චිත්‍රපට පිටපත ඉහළ කළමනාකාරීත්වයට ඉදිරිපත් කර ඇත. රූගත කිරීම් ආරම්භව ඇති අතර ඊට මූල්‍යමය දායකත්වය ලැබී ඇත.
6. '40' වන පාර්ලිමේන්තු දිනය සැමරීම	6.1.ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, තාර්යභාරය, සම්ප්‍රදාය , ඓතිහාසික, ගෘහ නිර්මාණමය සහ සමස්ත හරය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම 6.2.විවෘත පාර්ලිමේන්තු දිනයක් පැවැත්වීම 6.3. චිත්‍ර තරගාවලියක් සංවිධානය	-	එවකට රට තුළ පැවැති තත්ත්වය නිසා මෙම වැඩසටහන අවලංගු කරන ලදි

7.ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව අධ්‍යාපනික වටිනාකමකින් යුතු ග්‍රන්ථ, පත්‍රිකා සහ මෙවලම් සැකසුම ,සැකැසුම සහ මුද්‍රණය	7.1. විස්තරාත්මක ව්‍යාපෘති සංකල්පයක් නිර්මාණය කිරීම 7.2 පාර්ලිමේන්තුව, එහි කාර්යභාරය සහ සංකල්ප පිළිබඳ දැනුම පාසැල් ප්‍රජාව (වයස 4-10) වෙත ගෙන යාම 7.3. ප්‍රදර්ශනාත්මක ද්‍රව්‍ය නිර්මාණය කිරීම - ලිපිද්‍රව්‍ය, අත්පත්‍රිකා, පොත් පිංච 7.4. පින්තූර රාමුව, ප්‍රදර්ශන භාණ්ඩ නිර්මාණය කිරීම සහ සැලසුම් කිරීම 7.5. පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය 7.6. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය සමඟ අවශ්‍ය ද්‍රව්‍ය නිර්මාණය කිරීම සහ සැලසුම් කිරීම 7.7. පාර්ලිමේන්තුව ප්‍රචලිත කිරීම සඳහා සජීවීකරණ රූප සහ වීඩියෝ පට නිර්මාණය 7.8.ඡායාරූපකරණය, වීඩියෝකරණය,වීඩියෝ සංස්කරණය, පින්තූර සංස්කරණය, පිටි සැලසුම්කරණය පිළිබඳව අභ්‍යන්තර පුහුණු වැඩසටහන් 7.9.ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,න්‍යාය, සංකල්ප, කාර්යභාරය පිළිබඳ පූර්ණ දැනුමක් ලැබෙන පරිදි අත්පොතක් සකස්කිරීම මහජන සේවා නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා යාවත්කාලීන වන අත්පොතක් සැකසීම	100%	මෙම උපකරණ සඳහා සංකල්පය ඉදිරිපත් කර ඇති අතර ඊට මූල්‍යමය දායකත්වය ලැබී ඇත. *කුරුලු පාර්ලිමේන්තුව ළමා කථාව* මුද්‍රාපිතව ජාතික පුස්තකාලයේදී ළමා අංශයේදී එළි දැක්විණි. මෙහි සජීවීකරණ රූප සහ වීඩියෝ පට මාලාව නිර්මාණය වෙමින් පවතී.

8.ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පැමිණෙන රාජ්‍ය තාන්ත්‍රිකයන් , සුවිශේෂී පුද්ගලයන් ඇතුළු සියලුම අමුත්තන් පිළිගැනීම, දැනුවත් කිරීම සහ පාර්ලිමේන්තුව පිළිබඳ නිසි අවබෝධයක් ලබා	8.1. පාර්ලිමේන්තුවේ කාර්යභාරය සහ ඓතිහාසික වටිනාකම් පිළිබඳව නිවැරදි දැනුමක් පැමිණෙන අමුත්තන් වෙත ලබාදීම	100%	.

අභ්‍යන්තර විගණන අංශය

මෙම කාර්යාංශය විසින් 2022 වර්ෂයේදී ඉටු කරන ලද විශේෂිත කාර්යයන් පහතින් දක්වා ඇත.

- අවම කාර්ය මණ්ඩලයක් යටතේ වුවද වාර්ෂික විගණන සැලසුම ක්‍රියාත්මක කිරීමේදී 70%ක කාර්ය සාධනයක් ළඟාකර ගැනීම.
- 2022 වර්ෂය තුළ පාර්ලිමේන්තුවේ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලද අතර, කමිටුව විසින් ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- විගණන සැලසුමට පරිබාහිරව හදිසි හා අවස්ථාවෝචිත විගණන පරීක්ෂණ සිදු කර අදාළ අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.
- අභ්‍යන්තර පාලන ක්‍රම තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- රජයේ විගණන අංශය යොමු කළ විගණන විමසුම් අධ්‍යනය කොට කළමණාකාරීත්වයේ අවධානයට යොමු කොට වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.
- වසර 04කට පසු ආයතනයේ එක්රැස්ව පැවති අබලි ද්‍රව්‍ය අපහරනය කොට රු. මිලියන 4.3ක මුදලක් රජයේ ආදායමට බැර කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය

2022 වර්ෂයේදී විදේශ සම්බන්ධතා හා සන්ධාන කාර්යාංශය විසින් ප්‍රධාන වශයෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය සහ අන්තර් පාර්ලිමේන්තු සංගමය යන සංගම්වලට අදාළ සියලුම කාර්යයන් සහ සේවාවන් ඉටු කරන ලදී.

මෙහිදී පහත දැක්වෙන සමුළු, වැඩමුළු, සංචාර, රැස්වීම්, අධ්‍යයන චාරිකා යනාදියට අදාළ සියලුම කටයුතු සංවිධානය කරන ලදී.

- විකාශනය වන පාර්ලිමෙන්තු සම්බන්ධ 70 වෙනි වෙස්ට්මිනිස්ටර් සම්මන්ත්‍රණය - ලන්ඩනය, එක්සත් රාජධානිය, 2022 මාර්තු 14 සිට 18 දක්වා
- උසස් පාර්ලිමේන්තු සංවර්ධන නේවාසික වැඩසටහන,සිඩ්නි, නිව් සවුත් වේල්ස්, ඕස්ට්‍රේලියාව, 2022 මැයි 22 සිට 27 දක්වා

- දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන අනාරක්ෂිතභාවයට විසඳුම් සෙවීමේදී නියෝජිත සහ ඇතුළත් ආයතනවල කාර්යභාරය පිළිබඳ වැඩමුළුව, නිව්යෝක්, ඇමෙරිකා එක්සත් රාජධානිය, 2022 ජුලි 04 සිට 09 දක්වා
- 65 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සම්මන්ත්‍රණය, හැලිපැක්ස්, කැනඩාව, 2022 අගෝස්තු 20 සිට 29 දක්වා
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කමිටු රැස්වීම, මාලේ, මාලදිවයින, 2022 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 01 දක්වා
- උසස් වෘත්තීය සංවර්ධන සහ නිපුණතා ගොඩනැගීමේ නේවාසික වැඩසටහන, කේප් ටවුන්, බටහිර කේප්, දකුණු අප්‍රිකාව, 2022 ඔක්තෝබර් 22 සිට 30 දක්වා
- ජාතික ආරක්ෂක නීති සම්පාදනය පිළබඳ සර්ව-පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව, ලන්ඩනය, එක්සත් රාජධානිය, 2022 නොවැම්බර් 01 සිට 03 දක්වා
- 144 වැනි අන්තර් පාර්ලිමේන්තු සමුළුව, නුසා ඩුවා, ඉන්දුනීසියාව, 2022 මාර්තු 20 සිට 25 දක්වා
- ආසියා පැසිෆික් කලාපය සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිළිබඳ 3 වැනි පාර්ලිමේන්තු සම්මන්ත්‍රණය, ඉස්ලාමාබාද්, පකිස්ථානය, 2022 සැප්තැම්බර් 12 සිට 16 දක්වා
- 145 වැනි අන්තර් පාර්ලිමේන්තු සමුළුව හා සම්බන්ධ රැස්වීම්, කිගාලි, රුවන්ඩා, 2022 ඔක්තෝබර් 08 සිට 18 දක්වා

- ගරු පාර්ක් බියෝන්ග් සේග් කොරියානු ජනරජයේ ජාතික සභාවේ කථානායකතුමා ඇතුළු දූත පිරිසේ ශ්‍රී ලංකා නිල සංචාරය, 2022 ජනවාරි 19 සිට 22 දක්වා

- අන්තර් පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම් මාටින් චුන්ගොන් මහතා සහ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරිනී ලෝරන්ස් මාෂල් මහත්මියගේ ශ්‍රී ලංකා නිල සංචාරය, 2022 සැප්තැම්බර් 11 සිට 14 දක්වා

ඉහත සංගම්වලට අමතරව ඇති ,

- අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර සංගම්වලට අදාළ රැස්වීම්, සමුළු හා වැඩමුළු සඳහා යන පාර්ලිමේන්තු නියෝජිත පිරිස්වල සංචාරයන් පිළිබඳ කටයුතු

- පාර්ලිමේන්තු මිත්‍ර සංගම්වලට අදාළ කටයුතු (දැනට සංගම් 55 ක් පමණ ක්‍රියාත්මක වෙමින් පවතී.)

- පාර්ලිමේන්තු නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද විවිධ විදේශීය අධ්‍යයන චාරිකා සම්බන්ධ කටයුතු.

- කථානායකතුමා, නියෝජ්‍ය කථානායකතුමා සහ නියෝජ්‍ය කාරක සභාපතිතුමා හමුවීමට පැමිණි විවිධ රාජ්‍යතාන්ත්‍රික හා අනිකුත් නියෝජිත කණ්ඩායම්වලට අදාළ සන්ධාන සහ මාධ්‍ය කටයුතු

- මැති ඇමතිවරුන්ගේ විදේශ ගමන්වලට අදාල වීසා, රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර සහ ගුවන් තොටුපළ විශේෂ අමුත්තන්ගේ පර්යන්තය වෙන්කිරීමේ කටයුතු සහ ගුවන් තොටුපළ සම්බන්ධ සන්ධාන රාජකාරී.

පරිච්ඡේදය - 03

වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	තත්‍ය 2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,166,281,000	2,753,390,000	ඒසීඒ-3
-	තැන්පතු		10,080,909	22,888,363	ඒසීඒ-4
28,000,000	අත්තිකාරම් ගිණුම්		34,540,390	37,513,734	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,210,902,299**	2,813,792,097	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,210,902,299**	2,813,792,097	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		1,073	365	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		3,210,901,226	2,813,791,732	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
1,351,700,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිල	**5**	1,342,110,874	1,267,607,928	ඒසීඒ-2(ii)
1,572,110,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	1,495,326,189	1,112,714,045*	ඒසීඒ-2(ii)
377,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	362,021,201	338,964,913	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	**8**	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	369,200	ඒසීඒ-2(ii)
3,300,810,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**3,199,458,264**	2,719,656,086	
	මූලධන වියදම්				
83,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	27,208,691	70,811,834	ඒසීඒ-2(ii)
54,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	20,357,364	169,753,548	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	ඒසීඒ-2(ii)
1,000,000	හැකියා වර්ධනය	**14**	999,600	2,474,752	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	ඒසීඒ-2(ii)
139,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**48,565,655**	243,040,134	
	තැන්පතු ගෙවීම්		20,843,021	23,724,215	ඒසීඒ-4
30,000,000	අත්තිකාරම් ගෙවීම්		30,731,629	29,360,934	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		51,574,650	53,085,149	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,299,598,569	3,015,781,369*	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(88,697,343)	(201,989,637)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(88,697,343)	(201,989,637)*	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			-	-	

* යලි ස්ථාපිත අගයන්

ඒයිඒ -සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	80,830,564	56,809,755*
අග්‍රිම ලැබීම්	3,166,281,000	2,753,390,000
අත්තිකාරම් අයකර ගැනීම්	35,326,991	37,485,236
තැන්පතු ලැබීම්	10,080,909	22,888,363
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,292,519,464**	**2,870,573,354**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,829,467,833	2,380,499,943*
සහනාධාර සහ මාරුකිරීම්	362,021,201	338,964,913
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	889,052	4,484,609
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,073	365
අත්තිකාරම් ගෙවීම්	30,731,629	29,360,934
තැන්පතු ගෙවීම්	20,843,021	23,724,215
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,243,953,809**	**2,777,034,979**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**48,565,655**	**93,538,375**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	48,565,655	243,040,134
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**48,565,655**	**243,040,134**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(48,565,655)**	**(243,040,134)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**(149,501,759)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	149,501,759
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**149,501,759**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**149,501,759**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

* යලි ස්ථාපිත අගයන්

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	17,391,036,842	17,379,457,067
කල් බදු වත්කම්		8,750,000	8,750,000
මූල්‍ය වත්කම්			
කල් බදු වත්කම් ආයෝජනය		3,672,490	5,450,080
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	95,514,231	99,322,991
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**17,498,973,563**	**17,492,980,138**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		92,264,613	85,311,262
දේපළ පිරියත හා උපකරණ සංචිතය		17,391,036,842	17,379,457,067
කල් බදු වත්කම් සංචිතය		8,750,000	8,750,000
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
කල්බදු ණය හිමියෝ		3,672,490	5,450,080
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	3,249,618	14,011,729
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**17,498,973,563**	**17,492,980,138**

පිටු අංක 8 සිට 60 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 61 සිට 70 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය :	දිනය :	දිනය : 2023.02.22

2

වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්ථන	3,307,810,000	3,300,810,000	3,199,458,264	97%
ප්‍රාග්ධන	132,000,000	139,000,000	48,565,655	35%

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්වය වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	7,763,422,300	7,763,422,300	-	100%
9152	යන්ත්‍රෝපකරණ	1,478,388,541	1,478,388,541	-	100%
9153	ඉඩම්	8,149,226,000	8,149,226,000	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	-		
9180	බදු දෙන ලද වත්කම්	8,750,000	8,750,000		100%

*විගණකාධිපති වාර්තාව අවසානයේ අමුණා ඇත.

පරිච්ඡේදය - 04
කාර්ය සාධන දර්ශකය

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% - 100%	75% - 89%	50% - 74%
1. පාර්ලිමේන්තු සභා ගර්භයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස්, ලිපිලේඛන, භාෂා පරිවර්ථක සේවා හා අනෙකුත් දෛනික සහායක සේවා ලබා දීම.	√		
2. පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම්, කමිටු රැස්වීම්, වෙනත් විශේෂිත කාරක සභා ආදී ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් නිසි පරිදි පවත්වා ගෙන යාම.	√		
3. පාර්ලිමේන්තු නිල වාර්තා ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තුව හා එහි කටයුතු පිළිබඳව අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම	√		
4. පාර්ලිමේන්තුව හා කාරක සභා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා ලේකම් කාර්යාල පහසුකම් ලබාදීම	√		
5. පාර්ලිමේන්තුව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම		√	

පරිච්ඡේදය - 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ප්‍රතිශතය		
			0-49%	50-74%	75-100%
සාමය ඇති කිරීම හා යුක්තිය හා සාධාරණය ඇති කරන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම	සෑම මට්ටමකින්ම ඵලදායි වගවීමේ හා විනිවිද පෙනෙන ආයතන සංවර්ධනය කිරීම	16.6.1 ඒ ඒ ක්ෂේත්‍ර අනුව අනුමත කරන ලද අයවැයෙහි කොටසක් ලෙස ආණ්ඩුවේ ප්‍රාථමික වියදම් 16.6.2 ජනගහනයෙහි රාජ්‍ය සේවය පිළිබඳව තමන්ගේ අවසන් අත්දැකීම පිළිබඳව සෑහීමකට පත්වන කොටස ***<u>දර්ශක</u>*** විනිවිධභාවය පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේනතුව විසින් ගන්නා ලද පියවර			
		• පාර්ලිමේන්තු කටයුතු හා කාරක සභා කටයුතු මාධ්‍ය සඳහා විවෘත කිරීම			√
		• හැන්සාඩ් හා කාරක සභා වාර්තා පාර්ලිමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම			√
		• කාරක සභා උපලේඛන පාර්ලිමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම			√
		• විවෘත පාර්ලිමේන්තු ක්‍රියාවලිය			√
		• මහජන සම්බන්ධතා වැඩසටහන්			√
		• තොරතුර දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා දීම			√
		• තොරතුරු ක්‍රියාකාරී ලෙස අනාවරණය කිරීම		√	
		• පාර්ලිමේන්තු ක්‍රියාදාමය සඳහා මහජන සහභාගීත්වය			√
		16.7 ජාතික බෙදා හැරීම් හා සසඳන විට රාජ්‍ය ආයතන වල තනතුරු අනුපාතය 16.7.2 තීරණ ගැනීම සඳහා ලිංගිකත්වය, වයස හා ආබාධිත බව හා සමාජ කොටස් ඇතුලත් කිරීම හා ප්‍රතිචාර දැක්වීම විශ්වාස කරන සමානුපාතික ජනගහනය ***<u>දර්ශක</u>***			

		ගරු කථානායකතුමා, පාර්ලිමේන්තුවේ දේශපාලන නියෝජන නායකයින් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ නායකත්වය යටතේ රාජ්‍ය ප්‍රතිපත්ති තන්ත්‍රය පිළිබඳ තිරණ ගන්නා කාරක සභා , එනම්, • පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව • ගෘහ කාරක සභා • සම්බන්ධතා කමිටු • පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාව පරිපාලන කටයුතු / ලේකම් කටයුතු • අංශ ප්‍රධානී හා සේවකයන් අතර • අංශ ප්‍රධානීන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ඉහළ කළමනාකාරිත්වය සමග • සමහරවිට, ඉහළ කළමනාකාරිත්වය සමග සේවකයන් අතර (දෙපාර්තමේන්තු අතර)	√ √		√ √ √ √ √
	16.10 ජාතික ව්‍යවස්ථාව හා ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුව මහජනතාවට තොරතුරු සඳහා ප්‍රවේශ වීම හා මූලික නිදහස ආරක්ෂා කිරීම සහතික කිරීම	16.10.2 මහජනතාවට තොරතුරු සඳහා ප්‍රවේශ වීමට ව්‍යවස්ථාමය හෝ ප්‍රතිපත්තිමය සහතිකය ***<u>දර්ශක</u>*** මහජනතාව විසින් පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා තොරතුරු ලබා ගැනීම **ඉල්ලුම මත** තොරතුරු දැන ගැනීමේ පනත යටතේ පාර්ලිමේන්තු පුස්තකාලය මගින් **පරිශීලකයන්ගේ අනාගත තොරතුරු අවශ්‍යතාවයන් සඳහා දැනටමත් සම්පාදිත ලේඛන සඳහා ප්‍රවේශය** තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජන සේවා පර්යේෂණ ප්‍රකාශන කාරක සභා වාර්තා වෙනත් පාර්ලිමේන්තු ප්‍රකාශන		√ √	√ √ √ √ √

පරිච්ඡේදය - 06
මානව සම්පත් පැතිකඩ

2022 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව පහත දැක්වේ

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව				දැනට සිටින සේවක සංඛ්‍යාව			
	පා.ම.ලේ	ගරු. කථානායකතුමා	ගරු. නියෝජ්‍ය කථානායකතුමා	ගරු.නි. කාරක සභා සභාපතිතුමා	පා.ම.ලේ	ගරු. කථානායකතුමා	ගරු. නියෝජ්‍ය කථානායකතුමා	ගරු.නි. කාරක සභා සභාපතිතුමා
ජ්‍යෙෂ්ඨ මට්ටම	60	8	5	5	57	8	5	5
තෘතීය මට්ටම	176	0	0	0	139	0	0	0
ද්විතීයික මට්ටම	268	12	6	6	216	12	6	6
ප්‍රාථමික මට්ටම	480	25	10	10	439	25	10	10
අනියම් / තාවකාලික	8	0	0	0	10	0	0	0
එකතුව (2022.12.31 දිනට)	992	45	21	21	861	45	21	21

පරිච්ඡේදය - 07
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ./ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිලියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙනන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		

3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අදාල නැත		රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය වෙනුවට වඩා වැඩිදියුණු කරන ලද පැකේජයක් භාවිතා කිරීම
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වැර්ෂික ඇස්තමේන්තු සක්ස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කලමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන්	ප්‍රායෝගික දුෂ්කරතා මඟ හරවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන	අනුකූල වේ		

	පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම.	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණය සිදු කරන ලදී. නමුත් නියමිත කාලසීමාව තුළ නොවේ.	එම කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ		- එම -
8.5	ගර්හිත භාණ්ඩ අපහරණයකිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ (තරමක් දුරට)		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	කෝවිඩ් 19 හේතුවෙන් හා QR ක්‍රමය හේතුවෙන් ඉන්ධන ලබා ගැනීම සීමා වීම	2023 වර්ෂයේ සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නැත		අක්‍රිය ගිණුම් නොමැත
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව	අනුකූල වේ		

	කටයුතු කොට එම ශේෂය මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		ඇතැම් ශේෂයන් තවමත් අයකර ගැනීමට නොහැකි වී තිබේ
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	අදාල තැන්පතුකරුවන් සඳහා සිහිකැඳවීම් ලිපි යවා ඇත.	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරිම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව එහි තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාල නොවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අදාල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම	අනුකූල වේ		

	පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.			
20	**විගණන ජේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්සය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම 01

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	පිඅයිසී/ඒ/පීජ්ආර්/01/22/62	ඔබේ අංකය / உமது இல. / Your No.		දිනය / திகதி / Date	2023 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,

පාර්ලිමේන්තුව.

ශීර්ෂය 016 -පාර්ලිමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 016 - පාර්ලිමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 ට අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ පුනරාවර්තන වැය විෂයන් 06 කින් රු. රු.74,000,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයන් 05 කට හා මූලධන වැය විෂයයක් වෙත මු.රෙ.66 මගින් මාරු කර තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය චක්‍රලේඛය සහ 2022 ජනවාරි 05 දිනැති අංක 01/2022 දරන මුදල් චක්‍රලේඛය මගින් විදුලි වියදම 10% කින් අඩු කිරීමට ක්‍රමවේද හා අධීක්ෂණ වගකීම් පවරා තිබුණද සමාලෝචිත වර්ෂයේ සමස්ත විදුලි වියදමේ ඉතිරියේ ප්‍රතිශතය සියයට 6.9 ක් වීමෙන් එම අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි.

(ඇ) පාර්ලිමේන්තුව තුළ ස්ථාපිත සභානායක කාර්යාලය, ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය, විපක්ෂ නායක කාර්යාලවල විදුලිය හා ජලය සඳහා පාර්ලිමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවීම් කර තිබුණු අතර එම කාර්යාලවලින් ඒ සඳහා යම් ප්‍රතිශතයක ප්‍රතිපාදනයක් හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (ඇමුණුම iii හි) බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණු සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් 08 ක එකතුව රු.9,486,836 ක බැරකම් 2023 වර්ෂයේ දී නිරවුල් කර තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම
(අ)	2013 දෙසැම්බර් 30 දිනැති අංක 234/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 ඡේදය		රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වැටුප් සකස් කිරීම සඳහා හඳුන්වා දී ඇති GPS පරිගණක වැඩසටහන වෙනුවට වෙනත් පරිගණක වැඩසටහනක් භාවිතා කරන්නේ නම් ඒ සම්බන්ධ වාර්තාවක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් වැටුප් සකස් කිරීම සඳහා යොදාගෙන ඇති වැඩසටහන සඳහා ලබාගත් අනුමැතියක් ඉදිරිපත් නොවීය.
(ආ)	1985 මැයි 10 දිනැති අංක 289 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය	-	රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු බව දක්වා ඇතත්, පාර්ලිමේන්තුවේ සියළුම වාහන

සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ඉක්මවූ රු.118,908 ක ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් සම්බන්ධයෙන් මු.රෙ.571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව 09 වන පාර්ලිමේන්තුවේ රැස්වීම් වාර 101 ක් පවත්වා තිබුණු අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 න් 150 ක ට වැඩියෙන් සහභාගී වී තිබුණු රැස්වීම් වාර ගණන 81 ක් පමණක් විය.එසේම මුළු රැස්වීම් 101 න් රැස්වීම් වාර 20 ක් සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 150 ක ට වඩා අඩුවෙන් සහභාගී වී තිබුණි.තවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 200 කට වඩා වැඩියෙන් සහභාගී වී තිබුණේ රැස්වීම් වාර 12 කට පමණක් විය.

(ආ) පාර්ලිමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටු කිරීම සඳහා ප්‍රමුඛ දායකත්වය සපයනු ලබන ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව ඉටු කරන ලද කාර්යයන්හි කාර්යසාධනය පහත දැක්වේ.

(i) **පනත් කෙටුම්පත් සම්මත කිරීම**

සමාලෝචිත වර්ෂය තුළ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ රජයේ පනත් කෙටුම්පත් 46 ට අමතරව ඉදිරිපත් කර තිබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 31 න් ගරු කථානායක තුමා විසින් සහතිකය සටහන් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් සංඛ්‍යාව 02 ක් විය.

(ii) **අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පැවැත්වීම**

සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා ආයතන 46 ක් සඳහා රැස්වීම් වාර 59 ක් පවත්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii) රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විගණකාධිපති වාර්තා විමර්ශනය සඳහා කාරක සභා රැස්වීම් 60 ක් පැවැත්වීමට අපේක්ෂිතව තිබූ නමුත් එයින් කාරක සභා රැස්වීම් 38 ක් පමණක් පවත්වා තිබුණි.

(iv) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

සමාලෝචිත වර්ෂය තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ආයතන හා ව්‍යාපෘති , කමිටුව ඉදිරියට කැඳවීමේ ප්‍රගතිය සියයට 77.94 ක් විය.

(v) මහජන පෙත්සම් කාරක සභාව

කාරක සභාව වර්ෂය තුළ රැස්වීම් වාර 30 ක් පවත්වා තිබුණු අතර 2020 වර්ෂයේදී ලැබුණු පෙත්සම් 134 ක්, 2021 වර්ෂයේදී ලැබුණු පෙත්සම් 143 ක් සහ සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පෙත්සම් 6 ක් ලෙස පෙත්සම් 283 ක් සලකා බලා තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.743,759,062 ක් වූ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි.ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 13 හි 4 ඡේදය ප්‍රකාරව නියමිත ආකෘතියෙන් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණු අතර එහි 4.2.1 ප්‍රකාරව පිළියෙල කළ යුතු සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ මූලධන ප්‍රසම්පාදන කාර්යයන් 34 ක් වෙනුවෙන් වූ ඇස්තමේන්තුගත වියදම රු.551,192,552 ක් විය. සමාලෝචිත වර්ෂයේ මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.132,000,000 ක් වූ නමුත් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.එසේම වර්ෂයේ අවසාන දිනට ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එහි ඵලදායීතාවය විගණනයේදී ඇගැයීමට ලක්කළ නොහැකි විය.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව 2022 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය සඳහාද කථානායක නිල නිවස , මාදිවෙල නිල නිවාස 108, නුවරඑළියේ සෙන්පති මැදුර නිවාඩු නිකේතනය හා අනුරාධපුරයේ මෙත් සෙවන නිවාඩු නිකේතනයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පුස්තකාලවලට අත්පත් කර ගන්නා ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය, සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පුස්තකාලය සම්බන්ධයෙන් පවත්වා නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

3.4.1. නිල නිවාස කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1993 මැයි 28 දින පැවති රැස්වීම් වාර්තා අනුව මාදිවෙල නිවාස සංකීර්ණයේ නිල නිවාස සඳහා 1993 වර්ෂයේ සිට අය කරනු ලබන රු.1,000 ක නිවාස කුලී මුදල සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මාදිවෙල නිල නිවාස ලබා දීමේදී පාර්ලිමේන්තු මහලේකම් සමඟ ඇති කර ගනු ලබන ගිවිසුම ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහෝසි වූ වහාම නිල නිවාස හිස් කර නැවත භාර දීම සිදු කළ යුතු අතර එසේ නිල නිවාස භාර නොදුන් කාලය වෙනුවෙන් මන්ත්‍රීවරයෙකුගෙන් දිනකට රු.500 බැගින් දණ්ඩන මුදලක් සහ අයවිය යුතු විදුලි,ජල බිල්පත් ඇතුලුව මන්ත්‍රීවරු 06 දෙනෙකුගෙන් රු.455,904 ක මුදලක් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 15 දින වන විට අයකර ගැනීමට හැකිවී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

(ඈ) 2020 දෙසැම්බර් 19 දිනැති අංක 20/1997/302/028 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මාදිවෙල නිල නිවාස ලබා ගැනීමට නොහැකි වූ මන්ත්‍රීවරුන් සඳහා මාසිකව රු.75,000 ක් ගෙවනු ලබන අතර 2021 වර්ෂයේ මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට සහ 2022 සැප්තැම්බර් මාසය දක්වා මන්ත්‍රීවරුන් 08 දෙනෙකුට පිළිවෙලින් රු.6,750,000 ක් හා රු.4,875,000 ක් එසේ ගෙවා තිබුණි.

(ඇ) මාදිවෙල නිල නිවාසවල ජල, විදුලි හා දුරකථන බිල්පත් සඳහා තැන්පතු ලෙස අය කරනු ලබන රු.1,000 ක මුදල, කාලීනව සමාලෝචනය කර සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2020 නොවැම්බර් 25 දින පවත්වා තිබූ නවවැනි පාර්ලිමේන්තුවේ පළමු ගෘහ්‍ය කාරක සභා සැසිවාරයේදී සාකච්ඡා වී තිබූ පරිදි ඒ ඒ අමාත්‍යාංශවලින් රජයේ බංගලා නිවාස ලබා දී ඇති අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් මාදිවෙල නිවාස සංකීර්ණයෙන් ලබා ගෙන පවතින මන්ත්‍රී නිල නිවාස ආපසු භාර දීමෙන් හා පාර්ලිමේන්තු මහලේකම් විසින් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමෙන් එම නිවාස හිස් කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2023 මැයි 16 දින වන විටත් අමාත්‍යවරුන් තිදෙනෙකු මාදිවෙල මන්ත්‍රී නිල නිවාසයන් ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා දී තිබූ නිල නිවස සඳහා අයවිය යුතු නිවාස කුලී රු. 27,857 ක මුදලක් ඔහුගේ මන්ත්‍රී දීමනාවෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.2. සේවක ණය ශේෂ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.398,701 ක ණය ශේෂය වර්ෂ 06 ක් ඉක්මවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තු පාලන ගිණුමේ හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.43,051 ක වෙනසක් වූ අතර 2020 හා 2021 වර්ෂවල එම වෙනස පිළිවෙලින් රු. 125,845 හා රු.43,022 ක් වී තිබුණි.

3.5 නොවිසඳුණු විගණන ඡේද

2020 සහ 2021 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල 3.4 සහ 3.5 ඡේදවල දැක්වෙන " 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙත සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන සහ උපදෙස්වලට පටහැනිව, "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකුට (බලපත්‍රය හිමි තනතුරට අදාල සක්‍රීය සේවා කාලය මාස 02 ත් වර්ෂ 01 ත් අතර) සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම.... " සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 995 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 861 ක් විය. ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීයික මට්ටමේ, ද්විතියික මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 03, 40, 52 හා 41 ක් ලෙස මුළු පුරප්පාඩු සංඛ්‍යාව 136 ක් විය.

(ආ) අනුමත අනියම්/තාවකාලික සේවක සංඛ්‍යාව 8 ක් වූ නමුත් ආයතනයේ තත්‍ය සේවක සංඛ්‍යාව 10 ක් වීමෙන් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් දෙදෙනෙක් බඳවා ගෙන තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.2 සන්නිවේදන දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීම

සන්නිවේදන දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය, යෝජිත වැටුපට සමාන මාසික දීමනාවක් මත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් තනතුරු වර්ග 4 ක් සඳහා නිලධාරීන් 14 දෙනෙක් ස්ථිර පදනමින් 2019 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. එමස්ම එම බඳවා ගැනීම් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් ද නොතිබුණි..

4.3 සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනීම

පාර්ලිමේන්තුවේ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 09 වෙනි දින ගැසට් පත්‍රයෙහි පළ කර තිබුණු දැන්වීම අනුව, අයදුම්පත් පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත 2021 අප්‍රේල් 30 වෙනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු බව සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයදුම්පත් භාර ගන්නා දිනට පසුව එනම්, 2021 මැයි 03 දින සිට 17 දින දක්වා ලැබී තිබුණු අයදුම්පත් 06 ක අයදුම්කරුවන්ටද ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීම් කර තිබුණු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයක් රහිතව සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් " නිලධාරියා නිදහස් කළ නොහැක. " ලෙස නිර්දේශ සහිතව එවන ලද අයදුම්පත්‍රයක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා පිළිගෙන තිබුණි.

(ආ) ගැසට් පත්‍රයේ දක්වා තිබූ සේවා පළපුරුද්දට වඩා අඩු සේවා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් දෙදෙනෙකු ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරා ගෙන තිබුණි. එසේම ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගෙන තිබූ අයදුම්කරුවන් 4 දෙනෙක්ගේ සේවා පළපුරුද්ද ගණනය කිරීම නිවැරදි වී නොතිබුණි.

(ඇ) නිලධාරීන් 07 දෙනෙකු සඳහා දී තිබූ ලකුණු ප්‍රමාණයන් සමාලෝචනය කිරීමේදී සේවා පළපුරුද්ද සඳහා වෙන් කර තිබූ ලකුණු 25 නිශ්චිත පදනමක් මත විධිමත්ව ලබා දී නොතිබුණු අතර අතිරේක සුදුසුකම් සඳහා වෙන් කර තිබූ මුළු ලකුණු 25 , බෙදා තිබූ ආකාරයද නිවැරදි නොවිණි.

(ඇ) තනතුර සඳහා තෝරා ගන්නා ලද එක් අයදුම්කාරිනියකගේ මූලික අධ්‍යාපන සුදුසුකම් අතිරේක සුදුසුකම් ලෙස සලකා ලකුණු ලබාදී තිබුණු අතර එම සුදුසුකම් තහවුරු කරන සහතික පත්වල නිරවද්‍යතාවය සනාථ කර ගෙන නොතිබුණි.

(ඉ) තෝරා ගෙන තිබු නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරිනියක් මාස 02 දින 23 ක කාල ප්‍රමාදයකින් පසුව එනම්, 2022 ජුනි 27 දින වැඩ භාර ගැනීමට අවස්ථාව ලබා දී තිබුණි.

(ඊ) මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධ චක්‍රලේඛයේ 03 (vii) ඡේදයට පටහැනිව එක් සහකාර පුස්තකාලයාධිපති පත්වීමක් සිදු කර තිබුණි.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එ.එස්.එස්. පෙරේරා
ෂ්ඨ සහකාර විගණකාධිප
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල